# ලංකා
# තේ පර්යේෂණායතනය

## 1967

වසර සඳහා

## වාර්ෂික වාර්තාව

### 1 වෙනි කොටස

එල්. එච්. ප්‍රණාන්දු, බී.එස්සී., පීඑච්.ඩී.

හා

ආර්. එල්. ද සිල්වා, බී.එස්සී(ලංකා), පීඑච්.ඩී (ලංඩන්), ඩී.අයි.සී.

විසින් සම්පාදිතයි

තලවාකැලේ, සාන්ත කුම්බස්හී,

ලංකා තේ පර්යේෂණායතනය මගින් ප්‍රකාශිතයි.

1969

# පටුන


| | පිටුව |
|---|---|
| මණ්ඩලය ... ... ... ... ... | 3 |
| නිලධාරී නාම ලේඛනය ... ... ... ... ... | 4 |
| ලංකා තේ පර්යේෂණායතන මණ්ඩලයේ සතලිස් දෙවන වාර්ෂික වාර්තාව (1967) | 9 |
| 1967 මාර්තු 23 වෙනි දින පැවැති මණ්ඩල රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාව ... | 15 |
| 1967 ජුලි 30 වෙනි දින පැවැති මණ්ඩල රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාව ... | 20 |
| 1967 ඔක්තෝබර් 7 වෙනි දින පැවැති මණ්ඩල රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාව ... | 22 |
| 1967 දෙසැම්බර් 4 වෙනි දින පැවැති මණ්ඩල රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාව ... | 26 |
| ෆෝර්ඩ්, රෝඩ්ස්, තෝර්න්ටන් සහ සමාගමේ වාර්තාව ... ... ... | 31 |
| ඔඩිටර් ජෙනරාල්වරයාගේ වාර්තාව ... ... ... ... | 39 |
| ලංකා තේ පර්යේෂණායතන මණ්ඩලයේ සභාපතිවරයාගේ වාර්තාව ... | 42 |
| 1967 දෙසැම්බර් 31 වෙනි දිනට ශේෂ පත්‍රය ... ... ... | |
| සාන්ත කූම්බ්ස් වතුයාය—කාරක ගිණුම 1967 ... ... ... | |
| සාන්ත ජෝයකිම් වතුයාය—කාරක ගිණුම 1967 ... ... ... | |
| 1967 සඳහා අය වැය ගිණුම ... ... ... ... ... | |
| 1967 සඳහා ස්ථාවර වත්කම් ලේඛනය ... ... ... ... | |

## මණ්ඩලය

(1967 දෙසැම්බර් 31 වෙනි දිනට)

---

**සභාපති** එෆ්. අමරසූරිය මහතා

**නිලබල සාමාජිකයෝ**

කෘෂිකර්ම අධ්‍යක්ෂක
එම්. එස්. පෙරේරා මහතා

ගරු මුදල් ඇමති
ජී. ඩී. ලෝස් මහතා විසින් නියෝජනය කෙරේ

සභාපති, ලංකා වැවිලිකරු සංගමය
බී. වරුසවිතාන මහතා

සභාපති, ලංකා වැවිලිකරු සංගමයේ ඒජංසි අංශය
ජී. අයි. ද ග්‍රැන්විල් මහතා

සභාපති, පහත රට නිෂ්පාදන සංගමය
ටී. සී. ඒ. ද සොයිසා මහතා

තේ පාලක
සී. පී. චංමුගම් මහතා

අධ්‍යක්ෂක, ලංකා තේ පර්යේෂණායතනය
ආචාර්ය ර්. එම්. වෙනරි

**පත්කළ සාමාජිකයෝ**

ලංකා වැවිලිකරු සංගමය මගින් පත් කළ අය
එස්. පී. වෛතිලිංගම් මහතා
ජී. බී. මිඩ්ල්ටන් මහතා
ඒ. පී. පින්වර් මහතා

ලංකා වැවිලිකරු සංගමයේ ඒජංසි අංශය මගින් පත් කළ අය
පී. ජේ. සී. ඩරන්ට් මහතා
ටී. ඒ. මෝයි මහතා
එම්. බී. හෝස්පොල් මහතා

ලංකා පහත රට නිෂ්පාදන සංගමය මගින් පත් කළ අය
එෆ්. අමරසූරිය මහතා
එස්. පත්මනාදන් මහතා
ජේ. එල්. ඩී. පීරිස් මහතා

සුළු ඉඩම් හිමියන් නියෝජනය සඳහා ගරු කෘෂිකර්ම හා ආහාර ඇමති තුමා විසින් පත් කළ අය
ඩී. ර්. හෙට්ටිආරච්චි මහතා
එම්. රාජේන්ද්‍රම් මහතා, එම්.බී.ඊ.

නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙනුවෙන් ගරු කෘෂිකර්ම හා ආහාර ඇමති තුමා විසින් පත් කළ අය
මහජන මන්ත්‍රී ඩී. ජේ. රණවීර මහතා

**ලේකම්** ඒ. සී. පෙරේරා මහතා

## නිලධාරි මණ්ඩලය

(1967 දෙසැම්බර් 31 වෙනි දිනට)

---

### අධ්‍යක්ෂක මණ්ඩලය

| | |
|---|---|
| අධ්‍යක්ෂක | ... ආර්. ඇම්. වෙනරි, බී.එස්.සී., පී.එච්.ඩී. (ලංඩන්) ඒ.ආර්.සී.එස්., ඩී.අයි.සී. |
| නියෝජ්‍ය අධ්‍යක්ෂක | ... ජේ. ඒ. එච්. ටොල්හර්ස්ට්, බී.එස්.සී. (රෙඩිං) |
| සහකාර අධ්‍යක්ෂක | ... එල්. එච්. ප්‍රනාන්දු, බී.එස්.සී., පී.එච්.ඩී. (ලංඩන්) |

### පර්යේෂණාංශ

**කෘෂිකර්ම රසායන විද්‍යාව**

| | |
|---|---|
| උපදේශක | ... ජේ. ඒ. එච්. ටොල්හර්ස්ට්, බී.එස්.සී. (රෙඩිං) |
| කෘෂිකර්ම රසායනඥ | ... වී. පී. බවානාදන්, බී.එස්.සී. (ලංකා) පී.එච්.ඩී. (එඩිං) ඒ.ආර්.අයි.සී. |
| පර්යේෂණ නිලධාරි | ... ඩබ්. එම්. ඩබ්. බී. මනිපුර, බී.එස්.සී. (ලංකා) පී.එච්.ඩී. (කේම්බ්‍රිජ්) |
| පර්යේෂණ සහයකයෝ | ... එස්. සන්දනම්, බී.එස්.සී. (ලංකා)<br>*එස්. සිවසුබ්‍රමානියම්, බී.එස්.සී. (ලංකා) |
| කර්මාන්තඥ සහයකයෝ | ... වී. ප්‍රනාන්දු<br>එස්. ජී. ජයසූරිය<br>ටී. සී. ඉසෙඩ්. ජේමන්<br>ටී. කුලරත්න, බී.එස්.සී. (ලංකා)<br>සී. සී. රාජසිංහම්<br>එම්. සිකුරාජපති, බී.එස්.සී. (ලංකා)<br>ඒ. සෝමරත්න, බී.එස්.සී. (ලංකා)<br>එස්. සුන්දරලිංගම්, බී.එස්.සී. (පූනා) |

**ජෛව රසායන විද්‍යාව**

| | |
|---|---|
| ජෛව රසායනඥ | ... ආර්. එල්. වික්‍රමසිංහ, බී.එස්.සී. (ලංකා) බී.එස්.සී. (ලංඩන්) පී.එච්.ඩී. (ෂෙෆීල්ඩ්) එෆ්.ආර්.අයි.සී. |
| ජෛව රසායනඥ (රස පිරියෙසුම්) | ... ඒ. එස්. එල්. තිරිමාන්න, බී.එස්.සී., පී.එච්.ඩී. (ලංඩන්) |
| පර්යේෂණ සහයකයෝ | ... *ජී. ආර්. රොබර්ට්ස්, බී.එස්.සී. (ලංකා) ඒ.ආර්.අයි.සී.<br>*ආර්. ආර්. සෙල්වේන්ද්‍රන්, බී.එස්.සී. (ලංකා) |
| කර්මාන්තඥ සහයකයෝ | ... යූ. එල්. එල්. ද සිල්වා, බී.එස්.සී. (ලංඩන්)<br>බී. පී. එම්. පෙරේරා<br>කේ. පී. ඩබ්. සී. පෙරේරා, බී.එස්.සී. (ලංකා)<br>*කේ. සිවපාලන්, බී.එස්.සී. (ලංකා) |

**කෘමි විද්‍යාව**

| | |
|---|---|
| කෘමි විද්‍යාඥ | ... ඩබ්. දන්තනාරායන, බී.එස්.සී. (ලංකා) පී.එච්.ඩී. (ලංඩන්) ඩී.අයි.සී. |
| පර්යේෂණ සහයක | ... ඩී. ජේ. ඩබ්. රණවීර |
| කර්මාන්තඥ සහයකයෝ | ... එස්. එන්. ප්‍රනාන්දු, බී.එස්.සී. (ලංකා)<br>එච්. බී. හේරත්, බී.එස්.සී. (ලංකා)<br>ඒ. කදිරවෙට්පිල්ලෙයි, බී.එස්.සී. (ලංකා)<br>සී. ෂන්මුගම් |

---

*එතෙර පුහුණුව.

**පැළෑටි ව්‍යාධි වේදය හා වට පණු වේදය**

| | |
|---|---|
| පැළෑටි ව්‍යාධි විද්‍යාඥ | ... *එන්. ෂන්මුගනාදන්, බී.එස්.සී. (ලංකා) පී.එච්.ඩී. (ලංඩන්) |
| පර්යේෂණ නිලධාරි | ... ආර් එල්. ද සිල්වා, බී.එස්.සී. (ලංකා) පී.එච්.ඩී. (ලංඩන්) ඩී.අයි.සී. |
| වටපණු විද්‍යාඥ | ... පී. සිවපාලන්, බී.එස්.සී. (ලංකා) පී.එච්.ඩී. (රට්ගර්ස්) |
| කර්මාන්තඥ සහයකයෝ | ... පී. වී. අරුල්ප්‍රගාසම්, බී.එස්.සී. (මද්‍රාසි) |
| | එස්. ආර්. ඒ. ප්‍රනාන්දු, බී.එස්.සී. (ලංකා) |
| | ඒ. ආර්. එම්. හසීම් |
| | පී. ඒ. ජෝන් |
| | ටී. මනිවාසගර් |
| | එස්. මුරුගයියා |
| | ඩබ්. ආර්. එෆ්. රුද්‍රිගු, බී.එස්.සී. (ලංකා) |
| | එස්. සමරජීව |
| | ටී. වී. සරවනපාවන්, බී.එස්.සී. (ලංකා) |

**පැළෑටි භෞත වේදය**

| | |
|---|---|
| පැළෑටි භෞත විද්‍යාඥ | ... යූ. පෙතියාගොඩ, බී.එස්.සී. (ලංකා) පී.එච්.ඩී. (ලංඩන්) ඩී.අයි.සී. |
| පර්යේෂණ නිලධාරි | ... වී. එස්. කුලසේගරම්, බී.එස්.සී. (ලංකා) පී.එච්.ඩී. (ලංඩන්) ජෙ.වි.සා. |
| පර්යේෂණ සහයකයෝ | ... එස්. කන්දයියා, බී.එස්.සී. (ලංකා) |
| | එස්. නාගරාජා, බී.එස්.සී. (ලංකා) එම්.එස්. (කැලිෆෝනියා) |
| | *ඒ. ආර්. සෙබස්තියන් පිල්ලේ, බී.එස්.සී. (ලංකා) |
| කර්මාන්තඥ සහයකයෝ | ... ඒ. එස්. බී. ගෝමස්, බී.එස්.සී. (ලංකා) |
| | ඩී. ජානකිරාම්, බී.එස්.සී. (මද්‍රාසි) එම්.එස්.සී. (නව දිල්ලි) |
| | එස්. ක්‍රිෂ්ණ පිල්ලේ, බී.එස්.සී. (ලංකා) |
| | ඒ. නානායක්කාර, බී.එස්.සී. (ලංකා) |
| | එච්. ආර්. සොලොමන් |
| | එච්. බී. විජේතුංග |
| | එස්. විමලධර්ම |

**සංඛ්‍යාති**

| | |
|---|---|
| සංඛ්‍යා ලේඛනඥ | ... පී. කනපතිපිල්ලේ, බී.එස්.සී. (ලංඩන්) එෆ්.එෆ්.එස්. |
| කර්මාන්තඥ සහයක | ... කේ. සීවරත්නම් |

**කර්මාන්ත ශිල්පාංශය**

| | |
|---|---|
| කර්මාන්ත ශිල්පඥ | ... ඩී. කීර්තිසිංහ, බී.එස්.සී. (ලංකා) පී.එච්.ඩී. (ලංඩන්) ඩී.අයි.සී. කේ.එන්ජී. ඒඑම්.අයි. කෙමී.ඊ. |
| තේ රසඥ | ... සී. එච්. වික්‍රමසිංහ |
| සංවර්ධන ඉංජිනේරු | ... ඩබ්. ජෝෂප්, බී.එස්.සී. (ලංකා) |
| පර්යේෂණ සහයකයෝ | ... එන්. එම්. අබ්දුල් ගපාර්, බී.එස්.සී. (ලංකා) |
| | *ඩබ්. සී. ඒ. ද සිල්වා, බී.එස්.සී. (ලංකා) |
| කර්මාන්තඥ සහයකයෝ | ... ඩබ්. ඒ. සී. ද. සිල්වා |
| | එස්. සමරසිංහම් |
| | ඒ. තේවදසන්, බී.එස්.සී. (ලංකා) |

---

* එතෙර පුහුනුව.

## ප්‍රාදේශීය සේවය

### පහත රට සේවය

| | | |
|---|---|---|
| සහකාර අධ්‍යක්ෂක | ... | එල්. එච්. ප්‍රනාන්දු, බී.එස්.සී., පී.එච්.ඩී. (ලංඩන්) |

පහත රට ස්ථානය රත්නපුර

| | | |
|---|---|---|
| පර්යේෂණ නිලධාරි | ... | ඩී. ටී. වෙත්තසිංහ, බී.එස්.සී. (ලංකා) පී.එච්.ඩී. (රෙඩිං) |
| ප්‍රාදේශීය උපදෙස් නිලධාරි | ...* | ජේ. වී. සබානායගම්, බී.එස්.ඒ. (ටොරොන්ටෝ) |
| කර්මාන්තඥ සහයකයෝ | | ඊ. ජේ. බී. ද සිල්වා, බී.එස්.සී. (ලංකා) |
| | | සී. කන්දප්පා, බී.එස්.සී. (ලංකා) |
| | | ඒ. ඒ. සී. කරුණාරත්න, බී.එස්.සී. (ලංකා) |
| | | ඩී. ඩී. කෘෂන් |
| | | එන්. එස්. රාජේන්ද්‍රම්, බී.එස්.සී. (මදුරාසි) |
| | | *ටී. එෆ්. සල්දීන්, බී.එස්.සී. (ලංකා) |
| | | එච්. එච්. සමරකෝන් |
| | | යූ. පී. ද එස්. වෛද්‍යනාත, බී.එස්.සී. (ලංකා) එම්.එස්.සී. (ලංකා) |
| | | එන්. යෝගරත්නම්, බී.එස්.සී. (අලහබාඩ්) |
| පරිපාලක නිලධාරි | ... | සී. කීර්තිරත්න, එෆ්.සී.සී.එස්. |
| ප්‍රධාන ලිපිකරු | ... | ආර්. අයි. පෙරේරා |
| ලඝුලේඛක | ... | එස්. කේ. පී. තම්බිමුත්තු |
| ගණක ලිපිකරු | ... | කේ. ඩී. බී. එච්. අබේගුණවර්ධන |
| විදුලි වැඩකරු | ... | බී. ටී. රණසිංහ |
| වැඩ ලිපිකරු | ... | ටී. ඩී. වී. කුරේ |

### කොට්ටාව අතුරු ස්ථානය තල්ගම්පොල

| | | |
|---|---|---|
| කාර්ය භාර නිලධාරි | ... | කේ. එච්. ජී. ගුනපාල |
| කර්මාන්තඥ සහයක | ... | එච්. ඩී. ජයසිංහ |

### දෙනියාය

| | | |
|---|---|---|
| කර්මාන්තඥ සහයක | ... | ජේ. අයි. එච්. බණ්ඩාරනායක |

### මැද රට සේවය

| | | |
|---|---|---|
| මැද රට විද්‍යා නිලධාරි | ... | ඩී. කාල්නයිද්‍රු, බී.එස්.සී. (ලංකා), පී.එච්.ඩී. (ලංඩන්) |
| ප්‍රාදේශීය උපදෙස් නිලධාරි | ... | එම්. කේ. වෛතිලිංගම් |
| කර්මාන්තඥ සහයකයෝ | ... | ටී. ඒ. මුණසිංහ |
| | | එච්. බී. රත්නායක |
| | | කේ. තිරුඥණසුන්දරන්, බී.එස්.සී. (ලංකා) |

### ඌව ස්ථානය

| | | |
|---|---|---|
| වැඩ බලන ප්‍රධාන උපදෙස් නිලධාරි | ... | එල්. එම්. ද ඩබ්. තිලකරත්න, බී.එස්.සී. (ලංකා) එම්.ඊ.ඩී. (කැලිෆෝනියා) |
| කර්මාන්තඥ සහයකයෝ | .. | ඒ. එම්. අබේසිංහ |
| | | එන්. එල්. සී. ප්‍රණාන්දු, බී.එස්.සී. (ලංකා) |
| | | එම්. ටී. සුබ්‍රමානියම්, බී.එස්.සී. (ලංකා) |
| ගණක ලිපිකරු | ... | ටී. ආර්. බී. සලේ |
| ලිපිකරු | ... | ඒ. සී. පෙරේරා |

## උපදෙස් සේවය

| | | |
|---|---|---|
| වැඩබලන ප්‍රධාන උපදෙස් නිලධාරි | ... | එල්. එම්. ද ඩබ්. තිලකරත්න, බී.එස්.සී. (ලංකා) එම්.ඊ.ඩී. (කැලිෆෝනියා) |
| පර්යේෂණ සහයක | ... | ආර්. කේ. නැතැනියෙල්, බී.එස්.සී. (පූනා) |

ප්‍රාදේශීය උපදෙස් නිලධාරීහු

| | | |
|---|---|---|
| පහතරට | ... | ජේ. වී. සබානායගම්, බී.එස්.සී. (ටොරොන්ටෝ) |
| මැදරට | ... | එම්. කේ. වෛතිලිංගම් |
| ඡායාරූප ශිල්පී | ... | ඩී. ජේ. එම්. හෙට්ටිආරච්චි |

## වතුයාය

සාන්ත කුම්බස්

| | | |
|---|---|---|
| කෘෂිකර්මාන්තඥ | ... | එල්. ඒ. සිවරත්නම්, බී.එස්.සී. (ඩුනෙම්) |
| ප්‍රධාන කම්හල් නිලධාරි | ... | වී. ඒ. ෆිනැන්ඩස් |
| වැඩබලන මුල් ලිපිකරු | ... | එච්. එන්. ද සිල්වා |
| ඇපොතිකරි | ... | එස්. පී. ද සිල්වා |
| ක්ෂේත්‍ර නිලධාරි | ... | ඩබ්. ආරියපාල |

සාන්ත ජොයකිම්

| | | |
|---|---|---|
| අධිකාරි | ... | ජී. එස්. මුත්තෙට්ටුවේගම |
| ප්‍රධාන කම්හල් නිලධාරි | ... | එම්. එස්. ඩබ්. විජේරත්න |
| මුල් ලිපිකරු | ... | ජී. එල්. ඒ. තෝමස් |
| ක්ෂේත්‍ර නිලධාරි | ... | ඩී. ඩී. පතිනායක |

## පරිපාලනය

| | | |
|---|---|---|
| ප්‍රධාන පරිපාලක නිලධාරි | ... | ඒ. සී. පෙරේරා |
| ගණකාධිකාරි | ... | එච්. එස්. ගුණවර්ධන, බී.ඒ. (ලංකා) |
| අධ්‍යක්ෂකගේ ලේකම් | ... | ජී. ඒ. එස්. ගුනසිංහ |
| පරිවර්තක–උපදේශක | ... | සී. ඈම්. ප්‍රණාන්දු, බී.ඒ. (ලංකා) |

ගණක අංශය

| | | |
|---|---|---|
| ගණක සහයක | ... | ඒ. එච්. බී. ඩයස් |
| වැඩ බලන ප්‍රධාන ලිපිකරු | ... | ඩබ්. ජේ. සැමුවෙල් |
| වැඩබලන දෙවු ගණක ලිපිකරු | ... | එම්. බී. පැලිස් |
| අභ්‍යාන්තර විගණන නිලධාරි | ... | අයි. රෙංගරාජ් |
| ගණක ලිපිකරුවෝ | ... | එච්. අත්තනායක |
| | | ජී. ඒ. කේ. පී. ද සිල්වා |
| | | කේ. පී. ගුණවර්ධන |
| | | එන්. එම්. ජයතිලක |
| | | එස්. කුලසබානාදන් |
| | | එන්. සච්තානන්දන් |
| | | යූ. සී. උනම්බුව |
| | | සී. බී. වරාවිට |
| | | ඩී. ඩබ්. වික්‍රමරත්න |
| | | එච්. සී. වික්‍රමසිංහ |

යතුරු ලියනාංශය

| | | |
|---|---|---|
| ලඝුලේඛකයෝ | ... | ඊ. සී. සී. බ්‍රෝහියර් |
| | | එස්. ඒ. එල්. එච්. ප්‍රණාන්දු |
| | | ටී. ජේ. හලල්දීන් |

| | | |
|---|---|---|
| | | බී. පී. ජෝන්ස් |
| | | පී. ඩබ්. උඩුවාවල |
| | | එස්. ඩී. ජේ. ජේ. විතාරනපතිරන |
| ලිපිකරු යතුරු ලියන්නෝ | ... | ජේ. ඇන්. ඇපාසිංහ |
| | | ඩී. ඩබ්. බර්තෝලෝමියුස් |
| | | සී. වී. ආර්. ඩී. පොන්සේකා |
| | | වී. කෝදගොඩ |
| | | එස්. බී. වැත්තැව |
| වාර්තා ලිපිකරු | ... | කේ. එල්. ද අල්විස් |
| තැපැල් ලිපිකරු | ... | එච්. ඩබ්. පෙරේරා |

වැඩ අංශය

| | | |
|---|---|---|
| විදුලිබල පෝර්මන් | ... | ඩබ්. ආර්. සොලොමන් |
| වැඩ ලිපිකරු | ... | ආර්. ඒ. ඩැනියෙල් |
| ගබඩාකරු | ... | අයි. පී. දිසානායක |
| මිකැනික්වරු | ... | ඩී. ඒ. එස්. ඕපාත |
| | | කේ. එස්. වඩිවේලු |
| විදුලි ශිල්පි | ... | කේ. ඒ. බෝවි |
| ලිපිකරු (වැඩ) | ... | කේ. එච්. ටී. දසනායක |

# ලංකා තේ පර්යේෂණායතනය

---

එක්දහස් නවසිය හැටහත වර්ෂය සඳහා ලංකා තේ පර්යේෂණායතන මණ්ඩලයේ හතලිස් දෙවන වාර්ෂික වාර්තාව.

---

ස්ථාපනය

1925 ඔක්තෝබර් 27 දතම අංක 12 දරණ ආඥා පනතින් ලංකා තේ පර්යේෂණායතනය ස්ථාපනය කරන ලදී.

ව්‍යවස්ථාව

මණ්ඩලයේ ව්‍යවස්ථාව ලංකා ව්‍යවස්ථා සංග්‍රහයෙහි (1956 සංශෝධනය) 438 වෙනි පරිච්ඡෙදයෙහිද පහත සඳහන් තේ පර්යේෂණ (සංශෝධිත) පනත් වලද අඩංගු වේ.

1957 මාර්තු 18 දතම 1957 අංක 8
1959 ජනවාරි 21 දතම 1959 අංක 2
1959 ජනවාරි 21 දතම 1959 අංක 3
1961 ජූනි 19 දතම 1961 අංක 57.

සංශෝධිත පනත්වල අංක යෙදීම 1956 සංශෝධිත ලංකා ව්‍යවස්ථා මාලාව හා එකඟ නොවන හෙයින් ඒකාබද්ධ කිරීමක් අවශ්‍යය.

මණ්ඩලයේ හා කමිටුවල සාමාජිකත්වය

**මණ්ඩලය**

ජනවාරි පළමු වන දිනට මණ්ඩලයේ සාමාජිකත්වය.

**සභාපති** — එෆ්. අමරසූරිය මහතා

**නිලබල සාමාජිකයෝ**

කෘෂිකර්ම අධ්‍යක්ෂක
ඩී. සී. එල්. අමරසිංහ මහතා

ගරු මුදල් ඇමති තුමා
ජී. ඩී. ලෝස් මහතා විසින් නියෝජනය කෙරේ.

සභාපති, ලංකා වැවිලිකරු සංගමය
බී. වරුසවිතාන මහතා

සභාපති, ලංකා වැවිලිකරු සංගමයේ ඒජංසි අංශය
ඒ. ජී. ශාප් පෝල් මහතා

සභාපති, ලංකා පහතරට නිෂ්පාදක සංගමය
ඩී. බී. එල්ලපොල මහතා

තේ පාලක
සී. පී. වංමුගම් මහතා

අධ්‍යක්ෂක, ලංකා තේ පර්යේෂණායතනය
ආචාර්ය ඊ. එම්. වෙනරි

පත්කළ සාමාජිකයෝ

ලංකා වැවිලිකරු සංගමය මගින් පත්කළ අය
එස්. පී. වෛතිලිංගම් මහතා
ජී. බී. මිඩ්ල්ටන් මහතා
ඒ. පී. පින්වර් මහතා

ලංකා වැවිලිකරු සංගමයේ ඒජංසි අංශය මගින් පත්කළ අය
පී. ජේ. සී. ඩරන්ට් මහතා
ටී. ඒ. මෝයි මහතා
ඩී. ඒ. නීල් මහතා

ලංකා පහතරට නිෂ්පාදක සංගමය මගින් පත්කළ අය
එෆ්. අමරසූරිය මහතා
එස්. පත්මනාදන් මහතා
ජේ. එල්. ඩී. පීරිස් මහතා

සුළු ඉඩම් හිමියන් නියෝජනය සඳහා ගරු කෘෂිකර්ම ඇමතිතුමා පත්කළ අය
ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතා, ජේ.පී.යූඑම්.
එම්. රාජේන්ද්‍රම්, එම්.බී.ඊ. මහතා, ජේ.පී.

නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙනුවෙන් ගරු ආහාර ඇමතිතුමා විසින් පත්කළ අය
මහජන මන්ත්‍රී ඩී. ජේ. රණවීර මහතා

ලේකම් ඒ. සී. පෙරේරා මහතා

නීතිපතිහු ජූලියස් සහ ක්‍රිසි සමාගම

විගණකවරු සීමාසහිත පෝඩ්, රෝඩ්ස්, තෝන්ටන් සහ සමාගම

මණ්ඩලයේ සාමාජිකත්වය පිළිබඳ පහත දැක්වෙන වෙනස්වීම් වාර්තා කෙරිණ.

ජී. අයි. ද ග්‍රැන්විල් මහතා 67.11.1 දින සිට ඒ. ජී. ශාප් පෝල් මහතා වෙනුවට පත්විය.

ටී. සී. ඒ. ද සොයිසා මහතා 67.3.29 වෙනි දින සිට ඩී. බී. එල්ලපොල මහතා වෙනුවට පත්විය.

එම්. එස්. පෙරේරා මහතා 67.4.31 වෙනි දින සිට ඩී. සී. එල්. අමරසිංහ මහතා වෙනුවට පත්විය.

එම්. බී. හෝස්පෝල් මහතා 67.10.13 වෙනි දින සිට ඩී. ඒ. නීල් මහතා වෙනුවට පත්විය.

ජේ. ඒ. එච්. වොල්හර්ස්ට් මහතා 67.4.1 සිට 67.6.30 දක්වා ආචාර්ය ඊ. එම්. වෙනරී වෙනුවෙන් වැඩ බැලීය.

රැස්වීම

මාර්තු 23, ජූලි 30, අගෝස්තු 17, ඔක්තෝබර් 7 සහ දෙසැම්බර් 4 යන දිනයන්හිදී, වසර තුල රැස්වීම් 5 ක් පැවැත්විණ.

පරිපාලන කමිටුව

1967 ජනවාරි මස, 31 වෙනි දිනට පරිපාලන කමිටුවේ සාමාජිකයෝ.

සභාපති ලංකා තේ පර්යේෂණායතන මණ්ඩලයේ සභාපති
එෆ්. අමරසූරිය මහතා

ලංකා තේ පර්යේෂණායතනයේ අධ්‍යක්ෂක

ආචාර්ය ඊ. එම්. චෙනරි

සාමාජිකයෝ

සී. පී. වංමුගම් මහතා
ජී. ඩී. ලෝස් මහතා
එස්. පත්මනාදන් මහතා
බී. වරුසවිතාන මහතා
ඩී. බී. එල්ලපොල මහතා
ඩී. ඒ. නීල් මහතා
ඒ. ජී. ශාප්පෝල් මහතා

ලේකම් ලංකා තේ පර්යේෂණායතන මණ්ඩලයේ ලේකම්
ඒ. සී. පෙරේරා මහතා

කමිටුවේ සාමාජිකත්වය පිළිබඳ පහත සඳහන් වෙනස් වීම් වාර්තා කෙරිණ.

ටී. සී. ඒ. ද සොයිසා මහතා 67.3.29 සිට ඩී. බී. එල්ලපොල මහතා වෙනුවට පත්විය.

ජී. අයි. ද ග්‍රැන්විල් මහතා 67.11.1 සිට ඒ. ජී. ශාප්පෝල් මහතා වෙනුවට පත්විය.

එම්. බී. හෝස්පෝල් මහතා 67.12.14 සිට ඩී. ඒ. නීල් මහතා වෙනුවට පත්විය.

ජේ. ඒ. එච්. ටොල්හර්ස්ට් මහතා 67.4.1 සිට 67.6.30 දක්වා ආචාර්ය ඊ. එම්. චෙනරි වෙනුවට වැඩ බැලීය.

රැස්වීම්

පෙබරවාරි 19, මාර්තු 5, අප්‍රියෙල් 25, අගෝස්තු 10, සැප්තැම්බර් 20 සහ නොවැම්බර් 13 යන දිනයන් හිදී කමිටු රැස්වීම් 6 ක් පැවැත්විණ.

## අත්හද බැලීම් සහ වතුයාය කමිටුව

1967 ජනවාරි 1 වෙනි දිනට අත්හද බැලීම් සහ වතුයාය කමිටුවේ සාමාජිකයෝ.

සභාපති ලංකා තේ පර්යේෂණායතනයේ අධ්‍යක්ෂක
ආචාර්ය ඊ. එම්. චෙනරි මහතා

නිලබල සාමාජිකයෝ

ලංකා තේ පර්යේෂණායතනයේ සභාපති
එෆ්. අමරසූරිය මහතා

ලංකා වැවිලිකරු සංගමයේ සභාපති
බී. වරුසවිතාන මහතා

ලංකා වැවිලිකරු සංගමයේ ඒජංසි අංශයේ සභාපති
ඒ. ජී. ශාප් පෝල් මහතා

ලංකා තේ පර්යේෂණායතනයේ දෙවු කාර්ය මණ්ඩලය

පත්කළ සාමාජිකයෝ

ලංකා තේ පර්යේෂණායතන මණ්ඩලය වෙනුවෙන්

එස්. පී. වෛතිලිංගම් මහතා
ඒ. පී. පින්වර් මහතා
ටී. ඒ. මෝයි මහතා

ප්‍රාදේශීය වැවිලිකරු සංගම් වෙනුවෙන්

බදුල්ල ... ... ... ආර්. එල්. හාර්වි මහතා
බණ්ඩාරවෙල ... ... ඒ. ඩී. ස්කොට් මහතා
දික්ඔය ... ... ... ඒ. මැකී මහතා
දිඹුල ... ... ... පී. සී. ඉන්ස් මහතා
මහනුවර ... ... ... සී. විජේනායක මහතා
කැළණිවැලි ... ... ඒ. අයි. ඊ. ද ක්‍රෙට්සර් මහතා
නුවරඑළිය ... ... ආර්. කේ. ක්‍රිෂ්ටි මහතා
සබරගමුව ... ... සී. එස්. ඉලංගකෝන් මහතා
දකුණුපලාත ... ... ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතා

ලංකා වැවිලිකරු සංගමයේ ඒජංසි අංශයේ නියෝජ්‍යත්වය
පී. ජේ. සී. ඩරන්ට් මහතා

තේ වෙළෙඳ සංගමයේ නියෝජ්‍යත්වය
ඩී. ඒ. නීල් මහතා

සාන්ත කුම්බස් වතුයාය අයි බලන්නා

සී. ඩබ්ලිව්. සී. මොසොප් මහතා

සැපයු/සකසු — ආචාර්ය එන්. ෂන්මුගනාදන්

කමිටුවේ සාමාජිකත්වය පිළිබඳ පහත සඳහන් වෙනස් වීම් වාර්තා කෙරිණ. සැපයු/සකසු වශයෙන් පී. කනපතිපිල්ලේ මහතා 67.9.1 සිට ආචාර්ය එන්. ෂන්මුගනාදන් වෙනුවට පත්විය.

**රැස්වීම්** — මාර්තු 21, සහ ඔක්තෝබර් 24 යන දිනයන්හි දී වර්ෂය තුල රැස්වීම් දෙකක් පැවැත්විණ.

## පත්වීම් කමිටුව

1967 ජනවාරි පළමු වෙනි දිනට පත්වීම් කමිටුවේ සාමාජිකයෝ

**සභාපති** — ලංකා තේ පර්යේෂණායතන මණ්ඩලයේ සභාපති
එෆ්. අමරසූරිය මහතා

**සාමාජිකයෝ** — ලංකා තේ පර්යේෂණායතනයේ අධ්‍යක්ෂක
ආචාර්ය ඊ. එම්. වෙනරි
සී. පී. චංමුගම් මහතා — ටී. සී. ඒ. ද සොයිසා මහතා
ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතා — ඩී. ඒ. නීල් මහතා

**ලේකම්** — ලංකා තේ පර්යේෂණායතන මණ්ඩලයේ ලේකම්
ඒ. සී. පෙරේරා මහතා

**රැස්වීම්** — වසර තුල රැස්වීම් නොපැවැත්විණ.

## ගොඩනැගිලි කමිටුව

1967 ජනවාරි 1 වෙනි දිනට කමිටුවේ සාමාජිකයෝ.

**සභාපති** — එස්. පී. වෛතිලිංගම් මහතා

**සාමාජිකයෝ** — ලංකා තේ පර්යේෂණායතන මණ්ඩලයේ සභාපති
එෆ්. අමරසූරිය මහතා

ලංකා තේ පර්යේෂණායතනයේ අධ්‍යක්ෂක
ආචාර්ය ඊ. එම්. වෙනරි
ජී. බී. මිඩිල්ටන් මහතා — ජේ. එල්. ඩී. පීරිස් මහතා

ලේකම් ලංකා තේ පර්යේෂණායතන මණ්ඩලයේ ලේකම්
ඒ. සී. පෙරේරා මහතා

රැස්වීම් පෙබරවාරි 13, අප්‍රියෙල් 21, ජුනි 19 සහ සැප්තැම්බර් 27 යන දිනයන්හි වසර තුල කමිටු රැස්වීම් හතරක් පැවැත්විණ.

එක්සත් රාජධානියේ විද්‍යා උපදේශක කමිටුව

1967 ජනවාරි පළමුවෙනි දිනට කමිටුවේ සාමාජිකයෝ.

සභාපති එෆ්. ආර්. ටබ්ස්, සී.බී.ඊ., එම්.ඒ., පී.එච්.ඩී., ඒ.ආර්.සී.එස්., ඩී.අයි.සී. (අධ්‍යක්ෂක නැගෙනහිර මෝලින් හී පර්යේෂණ ස්ථානය)

සාමාජිකයෝ ශ්‍රීමත් ෆ්‍රෙඩ්රික් බෝර්ඩන්, එම්.ඒ., සී.එස්.සී., ඩී.ටෙක්., එෆ්.ආර්.එස්. (අධ්‍යක්ෂක රොතම්ස්ටඩ් හී අත්හද බැලීම් ස්ථානය)

ටී. ඒ. බෙනට් ක්ලාක්, එම්.ඒ., පී.එච්.ඩී., එෆ්.ආර්.එස්., (ජෛව විද්‍යාව පිළිබඳ මහාචාර්ය, හා ජෛව විද්‍යාවන් පිළිබඳ විනෝතෘ නැගෙනහිර ඇන්ග්ලියා විශ්වවිද්‍යාලය)

සැපයූ එෆ්. ආර්. ටබ්ස්, එම්.ඒ., පී.එච්.ඩී., ඒ.ආර්.සී.එස්., ඩී.අයි.සී. වෙනස්වීම් නොමැති විය.

තේ පර්යේෂණායතන කනිටු නිලධාරි වෛද්‍ය අරමුදල් භාරකාර මණ්ඩලය

ලංකා තේ පර්යේෂණායතන මණ්ඩලයේ සභාපති
එෆ්. අමරසූරිය මහතා

තේ පර්යේෂණායතනයේ අධ්‍යක්ෂක
ආචාර්ය ඊ. එම්. වෙනරි

තේ පර්. ආ. ප්‍රධාන පරිපාලක නිලධාරි
ඒ. සී. පෙරේරා මහතා

තේ පර්. ආ. කනිටු නිලධාරීන්ගේ නියෝජිත
ඩබ්ලිව්. ජේ. සැමුවෙල් මහතා

රැස්වීම්

භාරකරුවන්ගේ රැස්වීමක් පෙබරවාරි 19 වෙනි දින පැවැත්විය.

තේ පර්යේෂණායතන නිලධාරී අර්ථ සාධක අරමුදල් භාරකරු මණ්ඩලය

තේ පර්යේෂණායතනයේ සභාපති (එෆ්. අමරසූරිය මහතා, ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතා, එස්. පී. වෛතිලිංගම් මහතා, එම්. කේ. වෛතිලිංගම් මහතා, පී. කනපතිපිල්ලේ මහතා සහ ආචාර්ය ඊ. එම්. වෙනරි (අධ්‍යක්ෂක තේ.පර්.ආ.) යන අය භාරකරුවෝ වූහ.

රැස්වීම්

භාරකරුවන්ගේ රැස්වීමක් පෙබරවාරි මස 19 වෙනි දින පැවැත්විණි.

මුදල්

වර්ෂය තුල ලැබුණු ආදයම රුපි: 4,988,351/- ක් විය. මෙය පසුගිය වසරේ ආදයමට වඩා රුපි: 425,668 කින් වැඩි විය. තේ සෙස් බද්ද පසුගිය වසර හා සසඳන විට රුපියල් 366,138 කින් වැඩි විය. සාන්ත කුම්බ්ස් වතුයායෙන් ලද ලාභය රුපි: 90,401 ක් විය. පසුගිය වසරේ එය රුපි: 189,302. සාන්ත ජොයකිම් වතුයායේ පාඩුව රුපි: 60,869/- ක් විය. පසුගිය වසරේ පාඩුව රුපි: 118,651 ක් විය. අනෙක් මාර්ගයන්ගෙන් ලත් ආදයම රුපි: 189,880 කි. පසුගිය වසරේ එය රුපි: 89,231 ක් විය. මෙය සැදුනේ මෙසේය—පොළිය රුපි: 39,582, කඩය හා මස් කඩ කුලිය රුපි: 2,885, අමු තේ කොළ විකිණීමෙන් රුපි: 59,120, ක්ලෝන අතු කැබෙලි විකිණීමෙන් රුපි: 9,954 විවිධ ලැබීම් රු: 78,339.

අයභාර වැය රුපි: 3,773,473 දක්වා වැඩිවිය. පෙර වසරේ එය රුපි: 3,625,385 කි.

ආයතනයේ වත්කම් වල එකතුව රුපි: 2,382,539 ක් විය. රජයේ ණය මුදලෙන් ඉතිරි ප්‍රමාණය වූ රුපි: 1,499,999 ඇතුලුව මුළු ණය තුරුස් ප්‍රමාණය රුපි: 2,643,364 ක් විය.

ප්‍රාග්ධන වියදම රුපි: 1,606,191 ක් විය. පසුගිය වසරේ එය රුපි: 1,838,668 කි. වියදම් වූ ප්‍රධාන ශීර්ෂයන් මෙසේය:

| | |
|---|---|
| ඉඩම් ... ... ... ... ... ... | රුපි: 246,617.61 |
| ජල සැපයුම ... ... ... ... ... | 45,469.00 |
| ගොඩනැගිලි ... ... ... ... ... | 856,334.00 |
| ගෘහ භාණ්ඩ හා උපකරණ ... ... ... ... | 72,894.00 |
| විද්‍යාගාර උපකරණ ... ... ... ... | 239,339.00 |
| යන්ත්‍රෝපකරණ ... ... ... ... ... | 15,016.00 |
| වාහන ... ... ... ... ... ... | 140,472.00 |

වියදම් වැඩිවීම විශේෂයෙන්ම පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් වාර්තා විණි:

| | |
|---|---|
| කනිටු නිලධාරි පඩි නඩි ... ... ... ... | 35,331.00 |
| විවිධ පඩි නඩි ... ... ... ... ... | 105,431.00 |
| දිනපතා පඩි ගෙවන කම්කරුවෝ ... ... ... | 160,660.00 |
| පුස්තකාලය හා ප්‍රකාශන ... ... ... ... | 67,058.00 |
| නිලධාරි ගමන් බිමන් ... ... ... ... | 11,011.00 |
| පහත රට ස්ථානය ... ... ... ... | 91,009.00 |

## ස්තුතිය

තේ කර්මාන්තය ඊට අදාල කරුණු සම්බන්ධයෙන් තේ පර්යේෂණායතනයට දෙන ලද සහයෝගය සම්බන්ධයෙන්, ලංඩනයේ ලංකා සංගමයටද, ලංකා වැවිලිකරු සංගමයටද, ලංකා වැවිලිකරු සංගමයේ ඒජංසි අංශයටද, ලංකා පහතරට නිෂ්පාදක සංගමයටද, අනෙක් ආයතන වලටද මණ්ඩලයේ නොවක් ස්තුතිය වාර්තා වේ.

## නීතිපතීහු

ජූලියස් සහ ක්‍රිසි සමාගම.

## විගණකවරු

ෆෝඩ්, රෝඩ්ස්, තෝන්ටන් සහ සමාගම තවදුරටත් ආයතනයේ විගණකවරුන් වශයෙන් කටයුතු කරයි. 1967 දෙසැම්බර් 31 වෙනි දිනට අවසන් වන වර්ෂය සම්බන්ධයෙන් විගණිත ගිණුම් ප්‍රකාශය හා ශේෂ පත්‍රය මේ සමඟ ඇත.

**1967 මාර්තු 23 වෙනි දින පෙ.ව. 10.30 ට**

**සාන්ත කුමබස් හි පැවැති**

**ලංකා තේ පර්යේෂණායතන මංඩල රැස්වීම් වාර්තාව**

---

පැමිණි අය:—එෆ්. අමරසූරිය මහතා (සභාපති), ඩී. බී. එල්ලපොල, ඒ. පී. පින්වර්, ඩී. ටී. හෙට්ටිආරච්චි, ජී. බී. මිඩ්ල්ටන්, ටී. ඒ. මෝයි, එස්. පත්මනාදන්, එම්. රාජේන්ද්‍රන්, ඒ. ජී. ෂාප්පෝල් යන මහත්වරු, ආචාර්ය ට්. එම්. වෙනරි (අධ්‍යක්ෂක, තේ.පර්.ආ.) සහ ඒ. සී. පෙරේරා (ලේකම්), සහකාර අධ්‍යක්ෂක ආචාර්ය එල්. එච්. ප්‍රණාන්දු ද පැමිණ සිටියේ ය.

ඩී. සී. එල්. අමරසිංහ, සී. පී. චන්මුගම්, පී. ජේ. සී. ඩරන්ට්, ජී. ඩී. ලෝස්, ජේ. එල්. ඩී. පීරිස්, එස්. පී. වෛතිලිංගම් සහ බී. වරුසවිතාන යන මහත්වරු තමන්ට නොපැමිණිය හැකි බැව් දන්වූහ.

රැස්වීමට පෙර පහත සඳහන් ගොඩනැඟිලි පරීක්ෂා කොට බලන ලදී:—

(1) කනිටු නිලධාරි නව නිවාස
(2) අල වගා පෙදෙස්
(3) ක්ෂෙත්‍ර අංක 1, 2, 3 සහ ජලාශය
(4) කර්මාන්ත ශිල්පාංශය හා කම්හල

1. <u>1966 දෙසැම්බර් 12 වෙනි දින පැවැති මණ්ඩල රැස්වීම් වාර්තා</u>

වාර්තාව අනුමත කෙරිණි.

2. <u>මණ්ඩලයේ හා කමිටුවල සාමාජිකත්වය</u>

වෙනස්වීම් කිසිවක් වාර්තා කිරීමට නොතිබිණ.

3. <u>1967 පෙබරවාරි 19 හා 1967 මාර්තු 5 වෙනි දින පවත්වන ලද පරිපාලන කමිටු රැස්වීම් වාර්තා</u>

1. 1967 පෙබරවාරි 19 වෙනි දින රැස්වීම

(අ) 1965 සඳහා සාන්ත කුමබස් හා සාන්ත ජෝයකිම් වතුයාය පිළිබඳ ගිණුම් හා විගණිත වාර්තාව. වාර්තාව හා ගිණුම් බාර ගැනිණ.

(ආ) අධ්‍යක්ෂකවරයාගේ නිවාඩු—අධ්‍යක්ෂකවරයා ඔහුගේ වාර්ෂික නිවාඩු 1967 මැයි මාසයේ දී ගැනීම මණ්ඩලය අනුමත කළාය.

(ඇ) වැඩබලන අධ්‍යක්ෂක—ආචාර්ය වෙනරි පිටව සිටින කාලයේදී නියෝජ්‍ය අධ්‍යක්ෂක ජේ. ඒ. එච්. ටොල්හර්ස්ට් මහතා ඔහු වෙනුවෙන් වැඩ බැලීම මණ්ඩලය අනුමත කළාය.

2. 1967 මාර්තු 5 වෙනි දින රැස්වීම

(අ) ගණකාධිකාරි තනතුර—පත්‍රිකා චක්‍ර ලේඛනය කිරීමෙන් කේ. ඒ. ආරියදාස මහතා ගණකාධිකාරි වශයෙන් පත් කිරීම අනුමත කරන ලද බව වාර්තා කරන ලදි. (සාමාජිකයන් 12 දෙනකු අනුමත කළ අතර 7 දෙනකු පිළිතුරු නොඑවන ලදි). තනතුර භාර ගැනීමට තමාට නොහැකි බැව් දන්වමින් අධ්‍යක්ෂකවරයා වෙත එවන ලද ලිපියක් සභාපතිතුමා ඉදිරිපත් කළේය. අවශ්‍ය සුදුසු කම් වාර්ටඩ් ගණකාධිකාරි අන්තර් මධ්‍ය විභාගය තෙක් පහල කොට, ගණකාධිකාරියකු වශයෙන් අවුරුදු 5 ක පළ පුරුද්දක් ද තිබිය යුතුය යනුවෙන් සංශෝධනය කොට තනතුර සඳහා නැවත දන්වීම පළ කළ යුතුයැයි සාකච්ඡාවෙන් පසු තීරණය කරන ලදි.

(ආ) i කෘෂිකර්ම රසායන විද්‍යාව හා ශස්‍ය විද්‍යාව පිළිබඳ උපදේශක—67-4-1 දින සිට ජේ. ඒ. එච්. වොල්හර්ස්ට් මහතා කෘෂිකර්ම විද්‍යාව හා ශස්‍ය විද්‍යාව පිළිබඳ උපදේශක වශයෙන් පත්කිරීම අනුමත කරන ලදී.

ii කෘෂිකර්ම රසායන විද්‍යාඥ—පත්‍රිකා චක්‍රලේඛනය කිරීමෙන්, ආචාර්ය වී. පී. බවානන්දන් කෘෂිකර්ම රසායනඥ වශයෙන් ද, කෘෂිකර්ම රසායන අංශයේ ප්‍රධානියා වශයෙන් ද පත් කිරීම අනුමත කරන ලද බව වාර්තා විය. මෙම තීරණය මණ්ඩලය අනුමත කළාය.

(ඇ) සී. බී. පොස්ටර් බාර්හැම් මහතා—ප්‍රධාන උපදෙස් නිලධාරී—1967 ජූනියේදී සී. බී. පොස්ටර් බාර්හැම් මහතා නිවාඩු යන විට ඔහුගේ ගිවිසුමත් අවසන් වන බව සඳහන් කර ගන්නා ලදී.

(ඈ) වැඩ බලන ප්‍රධාන උපදෙස් නිලධාරී, එල්. එම්. ද ඩබ්ලිව්. තිලකරත්න—පොස්ටර් බාර්හැම් මහතා නිවාඩු යන දිනයේ සිට වැඩබලන ප්‍රධාන උපදෙස් නිලධාරී වශයෙන් එල්. එම්. ද ඩබ්ලිව්. තිලකරත්න මහතා පත් කිරීම අනුමත කළාය.

(ඉ) එස්. නාගරාජා, පර්යේෂණ සහයක, පැලෑටි භෞතවේදි අංශය—අවුරුදු දෙකකට නොවැඩි වන කාලසීමාවක් සඳහා පඩි රහිත නිවාඩු පිට නාගරාජා මහතාට ප්‍රධානය කොට ඇති ශිෂ්‍යත්වය බාර ගැනීම අනුමත කළාය.

(ඊ) එල්. ඒ. සීවරත්නම්, කෘෂිකර්මාන්තඥ—සාන්ත කූම්බ්ස් වතුයාය—1967 අප්‍රියෙල් 5 වෙනි දින සිට එල්. ඒ. සීවරත්නම් මහතා දෙවු ශ්‍රේණියට උසස් කිරීම අනුමත කළාය.

(උ) විද්‍යා නිලධාරීන් සඳහා අධ්‍යාපන නිවාඩු—නිර්දේශ කරන ලද අධ්‍යායන නිවාඩු ක්‍රමය අනුමත කළාය.

ජී. බී. මිඩ්ල්ටන් මහතාගේ යෝජනය ඒ. ජී. ෂාප් පෝල් මහතා ස්ථිර කිරීමෙන් 67-2-19 හා 67-3-5 වන දිනයන් හී පවත්වන ලද පරිපාලන කමිටු රැස්වීම් වාර්තා සම්මත විය.

4. <u>1967 පෙබරවාරි 13 වෙනි දින පවත්වන ලද ගොඩනැගිලි කමිටු රැස්වීම් වාර්තා</u>

අගරතැන්න අතුරු ස්ථානයේ කනිටු හා සුළු නිලධාරී නිවාස

අඩුම ටෙන්ඩර්කරුවූ පස්සර එස්. ඩී. සිල්වා මහතා වෙත කනිටු නිලධාරී නිවාසය (රුපි: 29,402.43) හා සුළු සේවක නිලධාරී නිවාස දෙක (19,805.40) තැනීමේ කොන්ත්‍රාත්තුව දෙන ලද බව සඳහන් කර ගන්නා ලදී.

එස්. පත්මනාදන් මහතාගේ යෝජනය ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතා ස්ථිර කිරීමෙන් 1967 පෙබරවාරි 13 වෙනි දින පැවැති ගොඩනැගිලි කමිටු රැස්වීම් වාර්තා සම්මත විය.

5. <u>1967 පෙබරවාරි 19 වෙනි දින පැවැති තේ. පර්. ආ. නිලධාරී අර්ථසාධක අරමුදල් භාරකරුවන් ගේ රැස්වීම</u>

(අ) 1965 සඳහා විගණිත වාර්තාව හා ගිණුම්—විගණිත වාර්තාව හා ගිණුම් පිළිගැනිණ.

(ආ) පොළිය—ආදයමෙහි අඩුවක් පියවීම සඳහා අවශ්‍ය රුපි: 4,148.69 ක පරිපූර්ණ වැයක් සම්මත විය.

ඩී. බී. එල්ලපොල මහතාගේ යෝජනය එස්. පත්මනාදන් මහතා ස්ථිර කිරීමෙන් තේ පර්යේෂණායතන නිලධාරී අර්ථ සාධක අරමුදල් භාරකරුවන්ගේ රැස්වීම් වාර්තා සම්මත විය.

6. **1967 පෙබරවාරි මස 19 වෙනි දින පැවැති කනිටු නිලධාරි වෛද්‍ය අරමුදල් භාරකරුවන්ගේ රැස්වීම් වාර්තා**

(අ) **1965—විගණිත වාර්තාව හා ගිණුම්—1965 විගණිත වාර්තාව හා ගිණුම් පිළිගැනිණ.**

එම්. රාජේන්ද්‍රම් මහතාගේ යෝජනය ඒ. පී. පින්වර් මහතා ස්ථිර කිරීමෙන් 1967 පෙබරවාරි 19 වෙනි දින පවත්වන ලද කනිටු නිලධාරි වෛද්‍ය අරමුදල් භාරකරුවන්ගේ රැස්වීම් වාර්තා සම්මත විය.

7. **නිලධාරි කටයුතු**

ආචාර්ය කීර්තිසිංහ, කර්මාන්ත ශිල්පඥ—ජාත්‍යන්තර පරිමිති ආයතනයේ ලාංකික නියෝජිතයා වශයෙන් ආයතනය වෙනුවෙන් අධ්‍යක්ෂකවරයා ආචාර්ය කීර්තිසිංහ නම් කරන ලද බව වාර්තා කරන ලදී.

මෙහි පළමු රැස්වීම 1966 මැයි මාසයේදී පැවැති අතර දෙවැනි රැස්වීම 1967 ජූනියේදී මොස්කව් නුවරදී පැවැත්වේ. මෙම ගමනේදී ආචාර්ය කීර්තිසිංහ ලංඩනයේ නතරවී නව යන්ත්‍ර යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් නිරත වන ලෙස අධ්‍යක්ෂකවරයා ඉල්ලා ඇත.

ලංඩනයේ සිටින කාලයේදී සති දෙකක නිවාඩුවක්ද, යැපීම් වශයෙන් දිනකට පවුම් 5 ක්ද ගමන් ගාස්තු සඳහා පවුම් 15 ක්ද ගෙවීමට මණ්ඩලය අනුමත කළාය.

8. **අනෙක් කරුණු**

(අ) මණ්ඩලයේ නීති
(ආ) කාර්ය සංවිධානය

මණ්ඩලයේ නීති හා කාර්ය සංවිධානය සලකා බැලීමටත්, ඒ පිළිබඳ නිර්දේශයන් ඉදිරිපත් කිරීම සඳහාත්, සභාපති, එස්. පත්මනාදන්, සහ ඩී. ඊ. හෙට්ටිආරච්චි යන මහතුන් ගෙන් සැදෙන කමිටුවක් පත් කරන ලදී. ලඟදීම මණ්ඩලයේ සාමාජිකත්වය අත්හරින ඩී. බී. එල්ලපොල මහතාවද මෙම කමිටුවට යා කර ගන්නා ලදී.

(ඇ) එක්සත් රාජධානියෙන් ශිෂ්‍ය පිරිසක්

ලන්ඩනයේ ලේමර් උසස් පාසලේ 6 වෙනි ශ්‍රෙණියේ ශිෂ්‍ය කණ්ඩායමක් ලංකාවට පැමිණෙන බවත් දින තුනකට හෝ හතරකට ඔවුන් ආගන්තුක නිවාසයේ නැවතී සිටින බවත් වාර්තා කරන ලදී.

මණ්ඩලය එකඟ වූවාය.

(ඈ) තේ පර්යේෂණායතන ක්‍රීඩා සමාජ පෙවිලියනය

පත්‍රිකා චක්‍රලේඛනය කිරීමෙන් අඩුම ටෙන්ඩර් කරුවූ ඩබ්ලිව්. එම්. අප්පුහාමි මහතා ගේ ටෙන්ඩරය ගොඩනැගිලි කමිටුව භාරගත් බව වාර්තා කරන ලදී.

**විස්තර මෙසේය**

| ටෙන්ඩර කරු | මුදල |
|---|---|
| ටී. ආර්. රාජවාසන් මහතා ... ... | රුපි: 23,970.00 |
| එම්. වයි. හේමචන්ද්‍ර සහ සමාගම ... ... | රුපි: 17,068.10 |
| ඩබලිව්. එම්. අප්පුහාමි මහතා ... ... | රුපි: 12,943.95 |

(ඉ) එක්සත් රාජධානියේ විද්‍යා උපදේශක මණ්ඩලයේ සාමාජිකයකුවූ ශ්‍රීමත් පෙඩ්රික් බෝඩන් ගේ පැමිණීම.

1967 ජූලි/අගෝස්තුවේදී ශ්‍රීමත් බෝඩන් ආයතනයට පැමිණෙන බව වාර්තා කරන ලදි. මේ පැමිණීම සම්බන්ධයෙන් ආයතනයට කිසිම වියදමක් දැරීමට සිදු නොවේ.

(ඊ) මණ්ඩලයේ මුද්‍රාව

පහත සඳහන් ලියවිලිවල මණ්ඩලයේ මුද්‍රාව තබන ලද බව වාර්තා කෙරිණ.

(i) උපකරණ ගබඩාව—පොදු ගබඩාව, සහ පොහොර ගබඩාව (හන්තාන) සීමාසහිත ෂෙල්ටන් සහෝදරයෝ

(ii) වැඩපොළ හා ගරාජය (හන්තාන)—සීමාසහිත ෂෙල්ටන් සහෝදරයෝ

(iii) මැණික් ගිවිසුම (සාන්ත ජොයකිම්) ඒ. ඩී. එස්. කරුණාරත්න මහතා

(iv) කනිටු නිලධාරි නිවාසය—(අග්‍රතැන්න අතුරු ස්ථානය)—එස්. බී. සිල්වා මහතා

(v) සුළු නිලධාරි නිවාසය—(අග්‍රතැන්න අතුරු ස්ථානය)—එස්. බී. සිල්වා මහතා

එස්. පත්මනාදන් මහතාගේ යෝජනය ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතා ස්ථිර කිරීමෙන් පහත සඳහන් ලියවිලිවල, මණ්ඩලයේ මුද්‍රාව තැබීම අනුමත වූවාය.

(i) ජල සැපයුම් යෝජනා ක්‍රමය (කොට්ටාව) සීමාසහිත වෝකර් පුත්‍ර සහ සමාගම (ගාල්ල)

(ii) තේ පර්යේෂණායතන ක්‍රීඩා සමාජ පැවිලියනය (සාන්ත කූම්බ්ස්)—ඩබ්. එම්. අප්පුහාමි

(උ) ගරු කෘෂිකර්ම හා ආහාර ඇමති, ඇම්. ඩී. බණ්ඩා මහතාගේ පැමිණීම. **1967** මාර්තු **25** වෙනි දින පෙ.ව. **9.30** ට ගරු කෘෂිකර්ම හා ආහාර ඇමති එම්. ඩී. බණ්ඩා මහතා පැමිණෙන බව වාර්තා කරන ලදි.

(ඌ) සාන්ත ජොයකිම් තේ

සාන්ත ජොයකිම් තේ ලන්ඩන් වෙළෙඳ පොළෙහි විකිණීම පිළිබඳ අධ්‍යක්ෂකවරයාගේ යෝජනය මණ්ඩලය අනුමත කළාය. සී.ටී.සී./රොටෝවේන් තේ ලන්ඩන් වෙළෙඳ පොළෙහි විකිණීමෙන්, කොළඹ දී විකුණනවාට වඩා වැඩි මිලක් ලබා ගත හැකිවේ.

(ඒ) බැංකු ගිණුම්

පහත සඳහන් ගිණුම් සම්බන්ධයෙන්, පහත නම් සඳහන් පුද්ගලයන් විසින් චෙක්පත් අත්සන් කිරීම පිළිබඳ වූ යෝජනය ටී. ඒ. මෝයි මහතා යෝජනා කොට ඩී. බී. එල්ලපොල මහතා ස්ථිර කිරීමෙන් අනුමත විය.

1. ලංකා බැංකුව—බදුල්ල

තේ පර්. ආ. ඌව ස්ථාන සාමාන්‍ය ගිණුම අංක **3558** පහත නම් සඳහන් අයගෙන් දෙදෙනකු චෙක්පත් අත්සන් කළ යුතුවේ.

(අ) එල්. එම්. ද ඩබ්ලිව්. තිලකරත්න මහතා, විද්‍යා නිලධාරී, ඌව
(ආ) එන්. එල්. සී. ප්‍රනාන්දු මහතා, කර්මාන්තඥ සහයක, ඌව
(ඇ) ආචාර්ය ඊ. ඇම්. වෙනරි, අධ්‍යක්ෂක, තේ පර්. ආ.
(ඈ) ඒ. සී. පෙරේරා, ප්‍රධාන පරිපාලක නිලධාරී, තේ පර්. ආ.

2. ලංකා බැංකුව, රත්නපුර

(i) තේ පර්. ආ. පහත රට ස්ථාන ගිණුම
(ii) සාන්ත ජොයකිම් වතුයාය සාමාන්‍ය ගිණුම
(iii) සාන්ත ජොයකිම් වතුයාය විශේෂ ගිණුම

පහත නම් සඳහන් අයගෙන් දෙදෙනකු චෙක්පත් අත්සන් කළ යුතු වේ:—

(අ) ආචාර්ය එල්. එච්. ප්‍රනාන්දු, තේ පර්. ආ. සහකාර අධ්‍යක්ෂක
(ආ) ජී. එස්. මුත්තෙට්ටුවෙගම මහතා, අධිකාරී සාන්ත ජොයකිම් වතුයාය
(ඇ) සී. කීර්තිරත්න මහතා, පරිපාලක නිලධාරී, තේ පර්. ආ. පහත රට ස්ථානය
(ඈ) ආචාර්ය ටී. එම්. වෙනරි, අධ්‍යක්ෂක, තේ පර්. ආ.
(ඉ) ඒ. සී. පෙරේරා මහතා, ප්‍රධාන පරිපාලක නිලධාරී, තේ පර්. ආ.

(ඒ) සාන්ත කුම්බස් වතුයාය

1967 සඳහා ප්‍රාදේශීය සමාජයට වතුයා මගින් ගෙවිය යුතු මුදල රුපි: 100/- බව ලංකා වැවිලිකරු සංගමයේ ඒජංසි අංශය මගින් තීරණය කොට ඇති බව වාර්තා කරන ලදි. රුපි: 100/- ක පරිපූර්ණ වැයක් සම්මත විය.

(ඔ) තේ වැවීම පිළිබඳ තුර්කියේ ඉංජිනේරුවකු පුහුණු කිරීම

මාස හයකට, තේ වැවීම පිළිබඳ තුර්කියේ ඉංජිනේරුවකු පුහුණු කිරීම සම්බන්ධයෙන් ආහාර හා කෘෂිකර්ම ආයතනය මගින් විදේශ කටයුතු අමාත්‍යංශයට යවන ලද ලිපියක පිටපතක් තමාට ලැබී ඇතැයි අධ්‍යක්ෂකවරයා පැවසීය. මාස හයකට පුහුණුවක් ලබාදීම නොහැකියැයිද, සතියක හෝ දින දහයක පුහුණුවක් ලබාදිය හැකි යැයි අධ්‍යක්ෂකවරයා පැවසීය. මණ්ඩලය එකඟ වූවාය.

(ඕ) ඩී. බී. එල්ලපොල මහතා

ඩී. බී. එල්ලපොල මහතා සහභාගි වන අවසාන රැස්වීම මෙය බව සභාපතිවරයා පැවසීය. පහත රට නිෂ්පාදක සංගමයේ සභාපති තනතුර ඔහු ලඟදීම අත් හරින්නේය. ඔහු මණ්ඩලයේ සාමාජිකයකුව සිටි කාලයේ දී කරන ලද අනගි සේවයට සභාපතිවරයා මණ්ඩලය වෙනුවෙන් ස්තුති කළේය. ආයතනයේ කටයුතු සම්බන්ධයෙන් එල්ලපොල මහතා දක්වන ලද උනන්දුව මණ්ඩලය ඉතා අගය කොට සලකන බවද ඔහු පැවසීය.

තමා පිළිබඳව දක්වන ලද අදහස් සම්බන්ධයෙන් එල්ලපොල මහතා සභාපතිවරයාට ස්තුති කළේය. මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් සේවය කරන්නට වීම සතුටකි, සභාපතිවරයාත් අනෙක් සාමාජිකයනුත් තමන්ට දෙන ලද සහය ඔහු අගේ කළ බව ද දක්විය.

ඒ. සී. පෙරේරා,
ලේකම්.

ලංකා තේ පර්යේෂණායතනය,
තලවාකැලේ.
1969-2-23.

## 1967 ජූලි මස 30 වෙනි දින පෙරවරු 9.00 ට කොළඹ පැවති ලංකා තේ පර්යේෂණායතන මණ්ඩල විශේෂ රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි

පැමිණි අය:—එෆ්. අමරසූරිය මහතා (සභාපති), සී. පී. වංමුගම්, ටී. සී. ඒ. ද සොයිසා, පී. ජේ. සී. ඩරන්ට්, ඩී. ඊ. හෙට්ටිආරච්චි, ජී. ඩී. ලෝස්, ටී. ඒ. මෝයි, ඩී. ඒ. නීල්, එස්. පත්මනාදන්, එම්. රාජේන්ද්‍රන්, එස්. පී. වෛතිලිංගම්, ජේ. ඒ. එච්. ටොල්-හර්ස්ට්, (තේ පර්.ආ. වැඩ බලන අධ්‍යක්ෂක) සහ ඒ. සී. පෙරේරා (ලේකම්) යන මහත්වරු.

තේ පර්. ආ. සහකාර අධ්‍යක්ෂක ආචාර්ය එල්. එච්. ප්‍රණාන්දු මහතා ද පැමිණ සිටියේය.

ඒ. පී. පින්වර්, ජේ. එල්. ඩී. පීරිස්, ඒ. ජී. ෂාප්-පෝල් සහ බී. වරුසවිතාරණ යන මහත්වරු තමන්ට නොපැමිණිය හැකි බැව් දන්වූහ.

1. තේ කොමිසම

මෙම විශේෂ රැස්වීම කැඳවූයේ තේ පර්යේෂණායතනයේ කටයුතු පිළිබඳව තේ කොමිසමට ඉදිරිපත් කළ යුතු සන්දේශය පිළිබඳ තීරණය කිරීම සඳහා බව සභාපති-වරයා පැවසීය. ආචාර්ය වෙනරි දිවයිනෙන් පිට සිටින හෙයින් මේ පිළිබඳව සාකච්ඡා කිරීමට ඔහු පැමිණෙන තුරු සිටිය යුතු යැයි අදහස් කරන ලදී. එහෙත් දැනට මූලික වශයෙන් සන්දේශයක් ඉදිරිපත් කළ යුතුයැයි ද පසුව ආචාර්ය වෙනරි පැමිණි පසු අතුරු සන්දේශයක් යැවිය යුතුයැයි ද පසුව කල්පනා කරන ලදී. ඒ අනුව සංදේශයක් ඉදිරිපත් කිරීමට අගෝස්තු 31 වෙනි ද තෙක් කල් ඉල්ලමින් තමන් විසින් තේ කොමිසම වෙත ලිපියක් ඉදිරිපත් කරන ලදී.

තේ පර්යේෂණායතනය පිළිබඳ දක්වා ඇති සැදහුම මේ පරිදිය:

> '' තේ පර්යේෂණායතනයෙන් එය ස්ථාපනය කරන ලද පරමාර්ථයන් විධිමත් පරිදි ඉටුවේ ද, නො එසේ නම් එහි සංවිධානය හා වැඩ කටයුතු පිළිබඳ කිනම් වෙනස් කම් අවශ්‍ය ද''.

සංදේශය ඉදිරිපත් කිරීමට දී තිබුණු කාලය 1967 අගෝස්තු 21 වෙනි ද තෙක් දීර්ඝ කරමින් තේ කොමිසම, ජූලි 28 වෙනි දින 'ඩේලි නිවුස්' පත්‍රයේ දැන්වීමක් පළ කොට තිබුණු බව ද ඔහු පැවසී ය.

ආයතනයේ අධ්‍යක්ෂකවරයා නොමැතිව පර්යේෂණ ගැන හෝ අනෙක් කටයුතු ගැන හෝ අදහස් පළ කිරීමට ඔවුන්ට නොහැකි බව තමාගේ මතය යැයි ද සභාපතිවරයා පැවසීය.

සන්දේශය සකස් කිරීම සඳහා මණ්ඩලයේ අනුකාරක සභාවක් පත් කළ යුතු යැයි ඔහු අදහස් කළේ ය. නීල් මහතා ගේ යෝජනය පත්මනාදන් මහතා ස්ථිර කිරීමෙන් පහත දැක්වෙන අනුකාරක සභාව පත් කරන ලදී.

> එෆ්. අමරසූරිය මහතා (සභාපති), සී. පී. වංමුගම්, ටී. සී. ඒ. ද සොයිසා, එස්. පත්මනාදන්, ඒ. ජී. ශාප්-පෝල්, ජේ. ඒ. එච්. ටොල්හර්ස්ට්, බී. වරුස-විතාන සහ ආචාර්ය එල්. එච්. ප්‍රණාන්දු යන මහත්වරු.

2. ගණකාධිකාරී තනතුර

එච්. එස්. ගුණවර්ධන මහතා ගණකාධිකාරී තනතුර භාර ගැනීමට සතුට පළ කොට ඇති බවත් 1967 අගෝස්තු 4 වැනි දින වැඩ භාර ගන්නා බවත් ලේකම්වරයා වාර්තා කළේය. චෙක් අත්සන් කිරීමට ගුණවර්ධන මහතාට බලය පැවරෙන ලිපියක් සාමා-ජිකයන් අතර චක්‍ර ලේඛනය කරන ලදී. එස්. පී. වෛතිලිංගම් මහතා ගේ යෝජනය එම්. රාජේන්ද්‍රම් මහතා ස්ථිර කිරීමෙන් පහත පෙනෙන යෝජනය ඒකමතිකව අනුමත කරන ලදී.

"පහත සඳහන් ගිණුම් සම්බන්ධයෙන්, ගණකාධිකාරී, එච්. එස්. ගුණවර්ධන මහතාට, චෙක්පත් හා අනෙක් බැංකු ලියවිලි වල අත්සන් තැබීමට බලය පැවරේයැයි අනුමත කළාය."

1. ලංකා තේ පර්යේෂණායතනය
2. තේ පර්. ආ. අර්ථසාධක අරමුදල
3. තේ පර්. ආ. කණිටු නිලධාරී වෛද්‍ය අරමුදල
4. සාන්ත කුම්බස් වතුයාය සාමාන්‍ය අරමුදල
5. සාන්ත කුම්බස් වතුයාය විශේෂ අරමුදල.

3. දකුණු ඉංදියාවේ එක්සත් වැවිලිකරුවන් ගේ විද්‍යා සම්මේලනය

සැප්තැම්බර් පළමුවෙනි දින පැවැත්වෙන මෙම සම්මේලනයේ දී ඩී. ඊ. හෙට්ටි-ආරච්චි මහතා මණ්ඩලය නියෝජනය කරන බවත් මැදරට විද්‍යා නිලධාරී ආචාර්ය ඩී. කාල්නයිදු සහ වැඩ බලන ප්‍රධාන උපදෙස් නිලධාරී එල්. එම්. ඩබ්ලිව්. තිලකරත්න මහතා ආයතනය නියෝජනය කරන බවත් මණ්ඩලය සඳහන් කර ගත්තාය.

රුපි: 4,000 ක පරිපූර්ණ වැයක් සම්මත විය. නියම ප්‍රමාණය විනිමය පාලක විසින් අනුමත කරනු ලබන ප්‍රමාණය යැයි ලෝස් මහතා පැවසීය. පෙ. ව. 10.30 ට රැස්වීම කෙළවර විය.

ඒ. සී. පෙරේරා,
ලේකම්.

ලංකා තේ පර්යේෂණායතනය,
තලවාකැලේ.
1969/1/27.

**වර්ෂ 1967 ඔක්තෝබර් 7 වෙනි දින පෙ. ව. 9 ට කොළඹ පැවති ලංකා තේ පර්යේෂණායතන මණ්ඩල රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාව**

පැමිණි අය:—එෆ්. අමරසූරිය (සභාපති), ටී. සී. ඒ. ද සොයිසා, ඒ. පී. පින්චර්, ඩී. ඊ. හෙට්ටිආරච්චි, ජී. ඩී. ලෝස්, ජී. බී. මිඩ්ල්ටන්, එස්. පත්මනාදන්, ජේ. එල්. ඩී. පීරිස්, එස්. පී. වයිතිලින්ගම්, බී. වරුෂවිතාන, ආචාර්ය ඊ. එම්. වෙනරි (අධ්‍යක්ෂක, තේ ප.ආ.) හා ඒ. සී. පෙරේරා (ලේකම්) යන මහත්වරු.

ආචාර්ය එල්. එච්. ප්‍රනාන්දු (සහකාර අධ්‍යක්ෂක තේ ප.ආ.), එච්. එස්. ගුණවර්ධන මහතා (ගණකාධිකාරී තේ ප.ආ.) සහ ජී. ඒ. එස්. ගුනසිංහ (අධ්‍යක්ෂකගේලේකම්) ද පැමිණ සිටියහ.

සී. පී. චංමුගම්, පී. ජේ. සී. ඩරන්ට්, ටී. ඒ. මෝයි, එම්. එස්. පෙරේරා සහ ඒ. ජී. ශාප්පෝල් යන මහත්වරු තමන්ට නොපැමිණිය හැකි බැව් දැන්වූහ.

1. වර්ෂ 1967 මාර්තු 23 වෙනි දින හා 1967 ජූලි 30 වෙනි දින පැවැති මණ්ඩල රැස්වීම් වාර්තා

(අ) 67.3.23 රැස්වීම් වාර්තා

ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතාගේ යෝජනය එස්. පත්මනාදන් මහතා ස්ථිර කිරීමෙන් වාර්තාව සම්මත විය.

(ආ) 67.7.30 වෙනි දින පැවැති විශේෂ රැස්වීම් වාර්තා

ජී. බී. මිඩ්ල්ටන් මහතාගේ යෝජනය එස්. පත්මනාදන් මහතා ස්ථිර කිරීමෙන් වාර්තාව සම්මත විය.

2. වාර්තාවෙන් උද්ගතවන කරුණු

මණ්ඩලයේ සංදේශය පිළිබඳව මණ්ඩල දූත පිරිස 1967 සැප්තැම්බර් 7 වෙනි දින තේ කොමිසන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් බව සභාපතිවරයා වාර්තා කළේය.

3. මණ්ඩලයේ හා කමිටුවල සාමාජිකත්වය

i. මණ්ඩලය

(අ) ලංකා පහත රට නිෂ්පාදන සංගමයේ සභාපති වශයෙන් ටී. සී. ඒ. ද සොයිසා මහතා, ඩී. බී. එල්ලපොල මහතා වෙනුවට 1967.3.29 වෙනි ද සිට පත්විය.

(ආ) වර්ෂ 1967 ජූලි 23 වෙනි ද සිට තවත් අවුරුදු 3 ක කාලයක් සඳහා සුළු ඉඩම් හිමියන් නියෝජනය සඳහා එම්. රාජේන්ද්‍රම් මහතා (එම්.බී.ඊ.) ගරු කෘෂිකර්ම හා ආහාර ඇමති තුමා විසින් නැවත පත් කරන ලදී.

(ඇ) වර්ෂ 1967 මාර්තු 30 වෙනිද සිට කෘෂිකර්ම අධ්‍යක්ෂක එම්. එස්. පෙරේරා මහතා, ඩී. සී. එල්. අමරසිංහ මහතාගේ තැන ගත්තේය.

(ඈ) වර්ෂ 1967 සැප්. 6 වෙනි ද සිට නිවාඩු පිට ගොස් 1967 පෙබරවාරි මාසය තෙක් නැවත නොපැමිණෙන හෙයින් ඩී. ඒ. නීල් මහතා ඉල්ලා අස්විය. ලංකා වැවිලිකරු සංගමයේ ඒජංසි අංශය මගින් නීල් මහතාගේ තැන ගැනීමට කිසිවකු තවම පත් නොකර ඇතැයි වාර්තා කරන ලදී.

ii. පරිපාලන කමිටුව

(අ) වර්ෂ 1967 මාර්තු 29 වෙනි ද සිට ටී. සී. ඒ. ද සොයිසා මහතා ඩී. බී. එල්ලපොල මහතාගේ තැන ගත්තේ ය.

4. වර්ෂ 1967 අප්‍රියෙල් 25, 1967 අගෝස්තු 10, 1967 සැප්තැම්බර් 20 යන දිනවල පැවැති පරිපාලන කමිටු රැස්වීම් වාර්තා.

(අ) වර්ෂ 1967 අප්‍රියෙල් 25 වෙනි දින රැස්වීම.

1965 වර්ෂය සඳහා ගිණුම් හා විගණිත වාර්තාව. වක්‍ර ලේඛණකාරයෙන් බෙදු හැරීමෙන් විගණිත ගිණුම් අනුමත කරන ලද බව වාර්තා කෙරිණ.

(ආ) ආයතනයේ මුදල් පිළිබඳව තේ කොමිසම වෙත යවන සන්දේශය. කෙටුම්-පත් කරන ලද සන්දේශය අනුමතිය සඳහා මුදල් පිළිබඳ අනුකාරක සභාව වෙත යවන ලෙස ලේකම්වරයා වෙත නියම කරන ලදී.

(ඇ) තේ කොමිසමේ නියෝජිතයන් සාන්ත කුම්බස් පැමිණීම. තේ කොමිසම සාන්ත කුම්බස් වෙත පැමිණෙන විට මණ්ඩලයේ සාමාජිකයන් සිටිය යුතුයයි තීරණය කරන ලදී.

(ඈ) අග්‍රතැන්න අතුරු ස්ථානය. අග්‍රතැන්න මිළ දී ගැනීම අත්හැරීම පිළිබඳව තමන් සීමාසහිත ජෝර්ජ් ස්ටුවට් සහ සමාගමේ විටෝල් මහතා සමග සාකච්ඡා කළ බව අධ්‍යක්ෂකවරයා පැවසීය. මෙම ව්‍යාපාරයට මුදල් සොයා ගැනීම සඳහා විවෘතව ඇති අනෙක් විධිත් සොයා බැලිය යුතුයැයි ඌව ප්‍රදේශයේ වැවිලිකරු සංගමයේ සභාපතිවරයා ගෙන් ලිපියක් ලැබී ඇතැයි ද ඔහු පැව-සීය. ඌව කාණ්ඩායමේ ඒජංතවරුන්ගෙන් මෙය බද්දට දෙන ලෙස ඉල්ලා සිටිය යුතු යැයිද ඌව ප්‍රදේශයේ වැවිලිකරු සංගමයේ සභාපතිවරයා යෝජනා කරයි. ඌව වතුයායවල ප්‍රයෝජනය සඳහා, අග්‍රතැන්න වතුයායේ ක්ලෝන පිළිබඳ අත්හද බැලීම් ගෙනයා යුතුයැයි. සාකච්ඡාවෙන් පසුව මණ්ඩලය තීරණය කළාය. එකඟවූ මිළට, අග්‍රතැන්න වතුයායෙන් අක්කර පනහක් මිළදී ගැනීමටද එකඟ විය. (එනම් අක්කර 32 ක තේ ඉඩම් අක්කරය රුපි: 1,500/- බැගින් අක්කර 2 පර්චස් 2, කොස් ඉඩම් අක්කරය රුපි: 250/1 බැගින්, අක්කර 12 ක පත්න ඉඩම අක්කරය රුපි: 250 බැගින්). මෙම ගෙවීම අවුරුදු පහක වාර්ෂික ගෙවීම ස්වරූපයෙන් ගෙවනු ඇත. එසේම ඉතිරි කොටස එකතුවූ මිළට අවුරුදු 5 ක් ඇතුළතදී මිළට ගැනීමට අවකාශ ඇත. මෙම කොන්දේසි අනුව ඌරි වතුකණ්ඩායමේ ඒජන්තවරුන් සමග සාකච්ඡා කරන ලදී.

ඉහත සඳහන් තීරණයන්ට යටත්ව 1967 සැප්තැම්බර් 20 වෙනි දින පැවැති පරිපාලන කමිටු රැස්වීම් වාර්තා, ටී. සී. ඒ. ද සොයිසා මහතා ගේ යෝජනය ජී. බී. මිඩ්ල්ටන් මහතා ස්ථිර කිරීමෙන් සම්මත විය.

5. වර්ෂ 1967 අප්‍රියෙල් 21, 1967 ජූනි 19 සහ 1967 සැප්තැම්බර් 27 යන දිනයන් හී පැවැති ගොඩනැගිලි කමිටු රැස්වීම් වාර්තා.

(i) වර්ෂ 1967 අප්‍රියෙල් 21 වෙනි දින රැස්වීම. වරුසවිතාන මහතාගේ යෝජනය හෙට්ටිආරච්චි මහතා ස්ථිර කිරීමෙන් 1967 අප්‍රියෙල් 27 වෙනි දින පැවැති රැස්වීම් වාර්තා සම්මත විය.

(අ) ඌව විද්‍යා නිලධාරී නිවාසය. ගොඩනැගිලි කමිටුව මගින් නිර්දේශ කරන ලද විශාල කිරීම් අනුමත කරන ලදී.

(ආ) තේ ප. ආ. ක්‍රීඩා සමාජ පෙවිලියනය. රුපි: 12,943/95 ක් සඳහා වූ ඩබ්. එම්. අප්පුහාමි මහතාගේ ටෙන්ඩරය පිළිගන්නා ලදී.

(ii) වර්ෂ 1967 ජූනි 19 වෙනි දින රැස්වීම.
පෙවිලියනය. තමන් තනන ගොඩනැගිලිවලට රක්ෂණ ඔප්පු ගැනීමට සුළු කොන්ත්‍රාත් කරුවන් ගෙන් ඉල්ලා සිටිය යුතුයැයි ටී. සී. ඒ. ද සොයිසා මහතා අදහස් කළේය. මණ්ඩලය මගින් අනුමත කිරීමට කලින් මින්පසුව සියළුම පරිපූර්ණ වැය පරිපාලක කමිටුව මගින් අනුමත කළ යුතුයැයි ලෝස් මහතා පැවසීය. ජේ. එල්. ඩී. පීරිස් මහතාගේ යෝජනය වරුසවිතාන මහතා ස්ථිර කිරීමෙන් ජූනි 19 වෙනි දින රැස්වීම් වාර්තා සම්මත විය.

(iii) වර්ෂ 1967 සැප්තැම්බර් 27 වෙනි දින රැස්වීම:

(අ) සාන්ත ජොයකිම් ජල සැපයීම හා වැසිකිලි

වැසිකිලි තැනීම ද, ජල සැපයීම පිළිබඳ දියුණු කිරීම ද මුදල් තත්වය සතුටුදායක වන තෙක් කල් දමන ලදී.

(ආ) අග්‍රතැන්න අතුරු ස්ථානය:

සුළු නිලධාරී නිවාස

සුළුනිලධාරී නිවාස දෙක නොතැනීමට තීරණය කරන ලදී.

කනිටු නිලධාරී නිවාස

ගෙවල් තනා නිම කිරීම ඔක්තෝබර් 10 වෙනිද තෙක් කොන්ත්‍රාත්කරු විසින් කල් දමන ලදී.

පරිපාලන කමිටුව වෙත යොමු කරන ලද කරුණුවලට යටත්ව 1967 සැප්තැම්බර් 27 වෙනි දින රැස්වීම් වාර්තා, එස්. පත්මනාදන් මහතාගේ යෝජනය ටී. සී. ඒ. ද සොයිසා මහතා ස්ථිර කිරීමෙන් සම්මත විය.

6. වර්ෂ 1967 මාර්තු 31 වෙනි දින පැවැති අත්හද බැලීම හා වතුයාය කමිටු රැස්වීම් වාර්තා

සභාපතිවරයාගේ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් පහත රට ස්ථානයේ කාර්මාන්ත ශිල්පය පිළිබඳ නිලධාරී හිඟයක් තිබෙන බව අධ්‍යක්ෂකවරයා පැවසීය. ලඟදී මෙම අංශයට පත්කරන ලද ආචාර්ය සිවප්‍රකාශපිල්ලේ එම තනතුරෙන් අස්වීමේ ලිපියක් එවා ඇත. එංගලන්තයේ පුහුණුව ලබා ඉංජිනේරුවකු වශයෙන් පෙරළා පැමිණ ඇති ජෝශප් මහතා සාන්ත කුම්බස් මෙන්ම සාන්ත ජොයකිම් හි ද වැඩ කරනු ඇත. කොළඹ ක්‍රම ශිෂ්‍යත්වයක් යටතේ කැනඩාව බලා පිටත්වූ සල්දීන් මහතාගේ තැනට පුහුණුවූ කර්මාන්ත සහකාරයකු එම ස්ථානයට යවන ලදී. තරල පත්ල වියලනය ලබන වසර අගදී ලංකාවට එවන බව පින්වර් මහතා ගේ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් අධ්‍යක්ෂකවරයා පැවසීය.

එස්. පී. වෛතිලිංගම් මහතාගේ යෝජනය ඩී. ජේ. හෙට්ටිආරච්චි මහතා ස්ථිර කිරීමෙන් 1967 මාර්තු 21 වෙනි දින පැවැති රැස්වීම් වර්තා අනුමත විය.

8. නිලධාරී කටයුතු

කොළඹ ක්‍රම ශිෂ්‍යත්ව

1968 වසර තුල දී පහත සඳහන් පර්යේෂණ සහායකයන් කොළඹ ක්‍රම ශිෂ්‍යත්ව සඳහා යෝජනය කරන ලද බව වාර්තා කරන ලදී. ආර්. කේ. නැතැනියල් මහතා, පර්යේෂණ සහායක උපදෙස් අංශය පත්වීම් දිනය 63.11.4. එස්. සන්දනම් මහතා, පර්යේෂණ සහායක, කෘෂිකර්ම රසායන අංශය පත්වීම් දිනය 63.11.1. ඇන්. ඇම්. අබ්දුල් ගපාර් මහතා, පර්යේෂණ සහායක, කර්මාන්ත ශිල්පාංශය 67.4.16.

විදෙස් පුහුණුවෙන් පසු පෙරලා පැමිණෙන නිලධාරීන් තමන් කළ වැඩ කටයුතු පිළිබඳව සුළු සටහනක් මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුයැයි ලෝස් මහතා අදහස් කළේය. නිලධාරීන් පුහුණු කිරීම සඳහා පිටරට යවනවා වෙනුවට පුහුණුවූ නිලධාරීන් බඳවා ගත යුතු යැයි වරුසවිතාන මහතා පැවසීය. පුහුණු වූ නිලධාරීන් ද ආයතනය මඟින් බඳවා ගනු ලැබී යැයි අධ්‍යක්ෂකවරයා පැවසීය. ඔවුන්ගෙන් කෙනෙකු දැන්මම අස් වී ඇත.

9. වෙනත් කටයුතු

(i) 1965 වර්ෂය සඳහා මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

චක්‍රලේඛනාකාරයෙන් විසුරුවා හැරීමෙන් පසුව 1965 වසර සඳහා මණ්ඩලයේ වාර්තාව සම්මත කරන ලද බව වාර්තා කෙරිණ.

(ii) මණ්ඩලයේ මුද්‍රාව

පහත සඳහන් ලියකියවිලි වල මණ්ඩලයේ මුද්‍රාව තබන ලද බව වාර්තා කරන ලදී.

1. කොටටාව අතුරු ස්ථානයේ ජල සැපයීම් යෝජනා ක්‍රමය:— සීමාසහිත වෝකර් පුත්‍ර සහ සමාගම ගාල්ල 67.6.1— වෙනි දින.

2. සාන්ත කුම්බස් හි ක්‍රීඩා සමාජ පෙවිලියනය තැනීම. ඩබ්. එම්. අප්පුහාමි, තලවාකැලේ 67.6.19 වෙනි දින.

3. සී. බී. පොස්ටර් බාර්හැම් මහතාගේ ඔප්පුව පැවරීම—විදේශ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් ක්‍රමය—67.8.9 වෙනි දින.

(iii) ලංකා තේ වල කෘමීන් හා කිඩැවන් හා ඔවුන් මර්ධන පිළිබඳ නිබන්ධනය—අංක-6—ජේ. ඊ. ක්‍රැනම් මහතා.

සාමාජිකයන් වෙත මෙම නිබන්ධනයේ පිටපත් බෙදා හරින ලදී. ආයතනයේ ප්‍රකාශන නොමිලේ බෙදා හරින ලබන උදවිය ද ඇතුළුව සියළුම දෙනාට මෙම ග්‍රන්ථය රු. 15/- බැගින් අය කොට බෙදා හැරීමට තීරණය කරන ලද බව ද එහෙත් මෙම ග්‍රන්ථය මුද්‍රණය කිරීම සඳහා සියයට පනහක් වැය කළ ලංකාවේ ෂෙල් සමාගම මෙයට විරුධත්වයක් දක්වතොත් ආයතනය වියදම් කළ ප්‍රමාණය ට සරිලන පරිදි එහි මිළ නියම කරනු ඇත.

(iv) මීලඟ රැස්වීම

මීළඟ රැස්වීම 1967 දෙසැම්බර් 4 වෙනි දින පෙ.ව. 9 ට කොළඹ පැවැත්වීමට තීරණය කරණ ලදී.

රැස්වීම පෙ.ව. 11.45 ට කෙළවර විය.

ජී. සී. පෙරේරා
(ලේකම්).

1968 නොවැම්බර් මස 14 වෙනි දින.

**1967 දෙසැම්බර් 4 වෙනි දින පෙ. ව. 9.00 කොළඹ පැවති ලංකා තේ පර්යේෂණායතන මණ්ඩල රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි**

පැමිණි අය:—සී. පී. චන්මුගම්, ටී. සී. ඒ. ද සොයිසා, පී. ජේ. සී. ඩරන්ට්, ඒ. පී. පින්වර්. ඩී. රී. හෙට්ටිආරච්චි, එම්. බී. හෝස්පෝල්, ජී. බී. මිඩ්ල්ටන් යන මහත්වරු සහ ආචාර්ය ඊ. එම්. චෙනරි (අධ්‍යක්ෂක තේ ප.ආ.), ඒ. සී. පෙරේරා මහතා (ලේකම්).

ආචාර්ය එල්. එච්. ප්‍රනාන්දු (තේ පර්.ආ. සහකාර අධ්‍යක්ෂක) සහ එච්. එස්. ගුණවර්ධන මහතා (ගණකාධිකාරී තේ පර්. ආ.) යන මහතුන් ද පැමිණ සිටියහ, සාන්ත කුම්බස් හා සාන්ත ජොයකිම් වතුයායවල ඇස්තමේන්තු සාකච්ඡා කරන විට ජී. එස්. මුත්තෙට්ටුවේගම සහ එල්. ඒ. සිවරත්නම් යන මහතුන් ද සිටියහ.

එෆ්. අමරසූරිය, ජී. ඩී. ලෝස් සහ බී. වරුසවිතාන යන මහතුන් තමන්ට නොපැමිණිය හැකි බැව් දන්වූහ.

එෆ්. අමරසූරිය මහතා නොපැමිණි හෙයින් රැස්වීමේ මුලසුනට ජී. බී. මිඩ්ල්ටන් මහතාගේ යෝජනය ඒ. පී. පින්වර් මහතා ස්ථිර කිරීමෙන්, එස්. පත්මනාදන් මහතා පත් කර ගන්නා ලදි.

## 1. 1967 ඔක්තෝබර් 7 වෙනි දින පැවැති මණ්ඩල රැස්වීමේ වාර්තා

ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතාගේ යෝජනය ජී. බී. මිඩ්ල්ටන් මහතා ස්ථිර කිරීමෙන් වාර්තාව අනුමත විය.

## 2. වාර්තාවෙන් උද්ගත වන කරුණු

(අ) තේ කොමිසම:

ආයතනයේ මුදල් තත්ත්වය පිළිබඳ අතුරු සන්දේශය තේ කොමිසම වෙත යවන ලද බවත් එහි පිටපත් මණ්ඩලයේ සාමාජිකයන් අතර චක්‍ර ලේඛනය කරණ ලද බවත් වාර්තා කෙරිණ.

(ආ) අග්‍රතැන්න අතුරු ස්ථානය:

අවුරුදු පහක වාර්ෂික ගෙවීමක් මගින් යූරි කණ්ඩායමේ අග්‍රතැන්න කොටසින් අක්කර පනහක් පමණක් මිළ දී ගැනීම සම්බන්ධ මණ්ඩලයේ තීරණය යූරි කණ්ඩායමේ නියෝජිතයන් වන ජෝජ් ස්ටුවට් සහ සමාගම වෙත දන්වන ලද බව වාර්තා කරන ලදි. මේ කරුණ පිළිබඳ යූරි කණ්ඩාය මේ අධ්‍යක්ෂකවරුන්ගේ සැලකිල්ල යොමුවන බව ආයතනය වෙත දන්වා එවා ඇත.

1967 දී තේ වවනු ලබන අක්කර පහට අමතරව පැරණි තේ ඉදිරු පෙදෙස් වලින් තවත් අක්කර පහක තේ වගා කළ යුතුයැයි පින්වර් මහතා යෝජනා කළේය. තේ ආධාර ක්‍රමය යටතේ රුපි: 68,000/- ක මුදලක් ලැබිය යුතුව ඇතැයි ද මේ වියදම් වෙනුවෙන් එම මුදල් යොද ගත හැකි යැයිද ඔහු පැවසීය. දැනට යෝජනා කොට ඇත්තේ අක්කර පනහක් මිල දී ගැනීමටය—එනම්, ක්ෂෙත්‍ර අංක 13 සහ 14 රෙහි අක්කර 38 සහ ලැහැබ් ඉඩම් වලින් අක්කර 12 කි. වාර මුදල් ගෙවීමක් අනුව ආයතනය පහත දැක්වෙන ඉඩම්ද ගත යුත්තේය.

| | | |
|---|---|---|
| ක්ෂෙත්‍ර අංක 12, 13 සහ 14 | ... | දළ වශයෙන් අක්කර 102 |
| කොස් ඉඩම් | ... ... ... | අක්කර 6 |
| පත්න ඉඩම් | ... ... ... | අක්කර 160 |

මෙම කරුණ පිළිබඳ තමන් තව දුරටත් සොයා බලන බවත් ජෝජ් ස්ටුවට් සමාගම සමඟ සාකච්ඡා කරන බවත් අධ්‍යක්ෂකවරයා පැවසීය. මෙම යෝජනා ක්‍රමය තව දුරටත් පවත්වා ගෙන යෑමට අවශ්‍යතාවය පින්වර් මහතා අවධාරණයෙන් පෙන්වා දුන්නේ ය.

වෛත්‍යලිංගම් මහතාගේ යෝජනය හෝස්පෝල් මහතා ස්ථිර කිරීමෙන්, 1968 දී තවත් අක්කර පහක තේ වගා කිරීම අනුමත කෙරිණ.

(ඈ) තරල පත්ල තේ වියලනය පිළිබඳ ගිවිසුම

ලන්ඩනයේ ජාතික පර්යේෂණ සංවර්ධන සංස්ථාවෙන් ලැබුණු තොරතුරු පරිපාලක කමිටුව මගින් දැඩි ලෙස සලකා බලන ලද බවත් මෙම ගිවිසුමට මණ්ඩලයේ මුද්‍රාව තැබීම කරන ලද බවත් වාර්තා විය. මෙම ගිවිසුම තේ පර්යේෂණ ආඥපනතට පටහැනි නොවේ යැයි ජූලියස් සහ ක්‍රිසි සමාගම උපදෙස් දී ඇති බවද වාර්තා කරන ලදි.

(ඈ) අංක-6 – නිබන්ධනය: ලංකාවේ තේ වල කෘමි හා කීඩෑ උවදුරු හා ඒවා මර්ධනය – එක් පොතක් රු. 15, බැගින් විකිණීමට සීමාසහිත ෂෙල් සමාගම කැමති වී ඇතැයි වෛතිලිංගම් මහාතාගේ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් අධ්‍යක්ෂකවරයා පැවසීය.

3. මණ්ඩලයේ හා කමිටුවල සාමාජිකත්වය

(i) මණ්ඩලය

(අ) 1967 ඔක්තෝම්බර් 29 වෙනිද සිට තවත් අවුරුදු තුනක කාලයකට සුළු ඉඩම් හිමියන් නියෝජනය සඳහා ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතා, ගරු කෘෂිකර්ම හා ආහාර ඇමති තුමා විසින් නැවතත් පත් කරන ලදි.

(ආ) ලංකා වැවිලිකරු සංගමයේ ඒජංසි අංශයෙහි සභාපති ජී. අයි. ද ග්‍රැන්විල් මහතා 1967 නොවැම්බර් 1 වෙනිද සිට ඒ. ජී. ෂාප්පෝල් මහතාගේ තැන ගත්තේය.

(ඇ) ඉල්ලා අස්වූ ඩී. ඒ. නීල් මහතා වෙනුවට 1967 සැප්තැම්බර් 13 වෙනිද සිට ලංකා වැවිලිකරු සංගමය මගින් එම්. බී. හෝස්පෝල් මහතා පත් කරන ලදි.

සභාපතිවරයා නව සාමාජිකයන් පිළිගත් අතර ඒ. ජී. ෂාප්පෝල් සහ ඩී. ඒ. නීල් යන මහතුන්ට ඔවුන් ගේ සේවාවන් වෙනුවෙන් ස්තුති කළේය.

(ii) පරිපාලන කමිටුව

ඩී. ඒ. නීල් මහතාගේ පුරප්පාඩුවට එම්. බී. හෝස්පෝල් මහතා පත්කර ගන්නා ලදි.

4. 1967 නොවැම්බර් 13 වෙනි දින පැවැති පරිපාලන කමිටු රැස්වීම් වාර්තා

(අ) 1968 ඇස්තමේන්තු

පහත දැක්වෙන පත්‍රිකාවන් සාකච්ඡා කරන ලදි.

(i) 1968 වියදම් පිළිබඳ සංශෝධිත ඇස්තමේන්තු සම්බන්ධ අධ්‍යක්ෂකවරයාගේ ලිපිය.

(ii) 1967 සඳහා මුදල් පිළිබඳ ප්‍රකාශනය

(iii) 1968 සඳහා අයවැය ඇස්තමේන්තු

(iv) 1968 සංශෝධිත ඇස්තමේන්තු

රුපියලේ වටිනාකම පහත හෙළීම නිසා ඇස්තමේන්තු වෙනස් විය හැකි බැව් මණ්ඩලය වෙත දන්වන ලදි. අගය අඩු කිරීම නිසා වැඩි කිරීමට සිදුවන වැය ශීර්ෂයන් පිළිබඳව මීලඟ රැස්වීමේදී සලකා බලන ලෙස පරිපාලක කමිටුවට නියම කරන ලදි.

1968 සඳහා වූ ඇස්තමේන්තු පරිපාලන කමිටුව මගින් සූක්ෂම අන්දමින් සලකා බලන ලද බවත් ඇස්තමේන්තු තවදුරටත් කපා හරින ලෙස අධ්‍යක්ෂකවරයාගෙන් ඉල්ලා සිටින ලදුයිද 1967 ඌනතාවයෙන් කොටසක් 1968 දි පියවා දැමීම සඳහා එසේ කරන ලදයිද සභාපතිවරයා පැවසීය. මේ අනුව අධ්‍යක්ෂකවරයා දළ ඇස්තමේන්තු රු. 208,079 කින් කපා දමන ලදී. සංශෝධිත ඇස්තමේන්තු පිළිබඳව අධ්‍යක්ෂකවරයා ඉදිරිපත් කළ සටහනෙහි, ඌනතාවය රු. 620,595 සිට රු. 312,516 දක්වා අඩු කිරීම සඳහා ඇස්තමේන්තු කපා දමන ලද අන්දම පැහැදිලි කොට තිබේ. 1969 අවසාන වන විට මේ හිඟ මුදල සම්පූර්ණයෙන්ම පියවා දැමිය හැකි වේතැයි බලාපොරොත්තු වන බව අධ්‍යක්ෂකවරයා පැවසීය.

පහතරට ස්ථානයේ ඇස්තමේන්තුවලින් කිසිවක් කපා නොමැතැයි වංමුගම් මහතා පැවසීය. අයභාර වැයෙන්, අධ්‍යක්ෂකවරයා සියයට පහක් කපා හරින ලදුයි ආචාර්ය ප්‍රණාන්දු පිළිතුරු දුන්නේය. සෑම වැයකින්ම කපා හැරීම අසීරුය. එසේ වුවද 1968 අවසාන වනවිට මුළු වැය ප්‍රමාණයෙන් සියයට 10 ක් ඉතිරි කොට පෙන්වන බවට ඔහු ප්‍රතිඥ දුන්නේය.

එක්සත් රාජධානියේ විද්‍යා උපදේශක කමිටුවේ වියදම් රුපි: 5,000 දක්වා අඩු කරන ලද බව අධ්‍යක්ෂකවරයා මණ්ඩලයට පෙන්වා දුන්නේය. ආචාර්ය ටබ්ස් මහතාගේ සේවයන් පමණි රඳවාගෙන ඇත්තේ.

මුදල් වර්ෂයේත් ඊට පෙර වර්ෂයේත් වැය ශීර්ෂයන් අතර විශාල වෙනසක් පෙනෙන විට ඒ පිළිබඳව සටහනක් දැක්විය යුතුයැයි වෛතිලිංගම් මහතා අදහස් කළේය. වතුයායන් පිළිබඳ ඇස්තමේන්තුවල අයවැය ප්‍රකාශයෙහි දක්වා ඇත්තේ ශුද්ධ ගණන්, එනම්, තේ ආධාර මුදල් වලින් ලැබෙන ආදායම හැර ගණන් බලන ලද ඇස්තමේන්තු වන බව වෛතිලිංගම් මහතාගේ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් අධ්‍යක්ෂකවරයා පැවසීය.

හෙට්ටිආරච්චි මහතාගේ යෝජනය සොයිසා මහතා ස්ථිර කිරීමෙන්, 1967 මුදල් පිළිබඳ සාරාංශය 1968 සඳහා අය වැය ප්‍රකාශය සහ 1968 ඇස්තමේන්තු සම්මත විය.

**(ආ) අන්තර දීමනා**

67-9-15 දතම අංක 729 හා 67-12-2 දතම අංක 734 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛනවල එන අන්තර දීමනා ගෙවීම මණ්ඩලය අනුමත කළාය.

**සොයිසා මහතාගේ යෝජනය වෛතිලිංගම් මහතා ස්ථිර කිරීමෙන් වාර්තා සම්මත විය.**

## 5. 1967 ඔක්තෝබර් 24 වෙනි දින පැවැති අත්හදබැලීම් හා වතුයාය කමිටු රැස්වීම් වාර්තා

**(අ) 1968 සඳහා සාන්ත කූම්බ්ස් වතුයාය ඇස්තමේන්තු**

මෙම ඇස්තමේන්තු, වතුයාය ඇස්තමේන්තු අනුකාරක සභාව මගින්ද අත්හද බැලීම් හා වතුයාය කමිටුව මගින්ද ඉතා සියුම් ලෙස පරීක්ෂා කරන ලද බව සභාපතිවරයා පැවසීය. සාන්ත ජොයකිම් ඇස්තමේන්තු වල ආධාර ක්‍රමයන් ගෙන් ලැබෙන මුදල් මූලධන වියදම් වලින් අඩු කොට ඇතත්, සාන්ත කූම්බ්ස් ඇස්තමේන්තුවල, ආධාර ක්‍රමයන් ගෙන් ලැබෙන මුදල්, මූලධන වියදම් වලින් අඩු කොට නැතැයි වෛතිලිංගම් මහතා පැවසීය. ඇස්තමේන්තුවල දක්වා ඇත්තේ නිත්‍යමූලධන වියදම් යැයිද, ලැබිය යුතුව ඇති ආධාර මුදල් ඇස්තමේන්තු පිළිබඳ විස්තර දැක්වෙන සටහනෙහි දක්වා ඇතැයිද කෘෂිකර්මාන්තඥ තැන පැවසීය. 1968 සඳහා සාන්ත කූම්බ්ස් වතුයාය ලාභය බැලීමේදී ආධාර මුදල් ප්‍රමාණයද ගණන් ගෙන ඇත.

**(ආ) සාන්ත ජොයකිම් වතුයාය 1968 ඇස්තමේන්තු**

මෙම ඇස්තමේන්තු ද වතුයාය ඇස්තමේන්තු අනුකාරක සභාව හා අත්හද බැලීම් හා වතුයාය කමිටුව මගින් සියුම් ලෙස සලකා බලන ලද බව සභාපතිවරයා පැවසීය. කමිටු දෙකෙහිම සාමාජිකයකු වූ ඩරන්ට් මහතා

මෙම ඇස්තමේන්තු පෞද්ගලිකවම සලකා බලන ලදී. ඔහු විසින් දෙන ලද සහය මණ්ඩලය අගේ කොට සලකන බව සභාපතිවරයා පැවසීය. සී.ටී.සී. ක්‍රමයට නිෂ්පාදනය කිරීමට මාරු කිරීමත් සමඟම සාන්ත ජොයකීම් තේ මිල ඇස්තමේන්තුව ශත 40 කින් වැඩි වී ඇතැයිද, මින් මතු වතුයායෙන් පාඩුවක් නොවෙනවා ඇතැයි තමා බලාපොරොත්තු වන බව සභාපතිවරයා පැවසීය. වඩා සියුම් ලෙස නෙලීමේ ප්‍රතිඵලයක් වශයෙන් නෙලීම් ගාස්තු ශත 11 කින් වැඩි වී ඇතැයි ආචාර්ය ප්‍රනාන්දු පැවසීය. මේ හේතුවෙන් පලදාව සියයට 10 කින් අඩුවන්නටද ඇත. අසාම් හී සෑම වතුයායක්ම පාහේ දැන් සී. ටී. සී. නිෂ්පාදන ක්‍රමය අනුගමනය කරන අතර එම තේ වලට ලැබෙන ඉහල මිල මේ නිසාම ලැබෙන බව පෙනේ.

සියුම්ව නෙලීම නිසාත් අක්කර 42 ක තේ උදුරා දැමීම නිසාත් නෙලීම් මිල අධික ලෙස ඉහල ගොස් ඇතැයි ෂන්මුගම් මහතාගේ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් අධිකාරී තැන පැවසීය. පින්චර් මහතාගේ යෝජනය මිඩ්ල්ටන් මහතා ස්ථිර කිරීමෙන් වතුයා දෙකෙහිම ඇස්තමේන්තු සම්මත විය. රුපියලෙහි අගය අඩුවීමේ හේතුවෙන් අවශ්‍ය වන අමතර වියදම් සඳහා අතිරේක ඇස්තමේන්තු ඉදිරිපත් කරන ලෙස කෘෂිකර්මාන්තඥ හා අධිකාරීතැනගෙන් ඉල්ලා සිටින ලදී. මේවා පරිපාලන කමිටුව විසින් සලකා බලනු ඇත.

ධරන්ට් මහතාගේ යෝජනය හෙට්ටිආරච්චි මහතා ස්ථිර කිරීමෙන් වාර්තා සම්මත විය.

හෙට්ටිආරච්චි මහතා රැස්වීමෙන් පිටවිය.

## 6. නිලධාරී කටයුතු

### (අ) ආචාර්ය යූ. පෙතියාගොඩ—පැලැටි භෞතවේදී

ලංකා තේවලට අදල භෞතවේදී ප්‍රශ්න පිළිබඳ හැදෑරීමට යූ. පෙතියාගොඩ මහතාට නියුපීල්ඩ් පදනම මගින් අධිශිෂ්‍යත්වයක් ප්‍රදනය කොට ඇතැයි අධ්‍යක්ෂකවරයා පැවසීය. රොතැම්ස්ටඩ්හි පර්යේෂණ ස්ථානයෙහි උද්භිත විද්‍යා අංශයෙහි ඔහු වැඩ කරනු ඇත. 1968 මාර්තුවේදී හෝ අප්‍රියෙල් වලදී ඔහු රොතැම්ස්ටඩ්හි සිටිය යුතුවේ. නියුපීල්ඩ් පදනම මගින් දි ඇති අධිශිෂ්‍යත්වය පිළිගැනීමත් 1968 මාර්තු/අප්‍රියෙල් හිදී ආචාර්ය පෙතියාගොඩ රොතැම්ස්ටඩ් යෑමත් මණ්ඩලය අනුමත කළාය.

### (ආ) ඒ. එච්. බී. ඩයස් මහතා—ගණක සහයක

අවුරුදු 31 ක සේවයෙන් පසු ඒ. එච්. බී. ඩයස් මහතා 1968 මාර්තු 31 වෙනි දින විශ්‍රාම ලබන බව වාර්තා කරන ලදී. ආයතනයට ඔහු විසින් දෙන ලද සේවය මණ්ඩලය අගය කොට සලකන බව වාර්තා කරන ලදී.

### (ඇ) ලංකා වෙළෙඳ සේවක සංගමය

තේ පර්. ආ. කනිටු පරිපාලන හා කාර්මික නිලධාරී සංගමය විසුරුවා හරින ලද බවත් නිලධාරීන් විසින් ලංකා වෙළෙඳ සේවක සංගමයේ ශාඛාවක් පිහිටුවා ගනු ලැබූ බවත් වාර්තා කරන ලදී.

## 7. වෙනත් කටයුතු

### (අ) විදේශ කෘෂිකර්ම පර්යේෂණ වැඩ සටහන යූ. එස්. ඩී. ඒ.

ලංකාවේ මුදල් වලින් කෘෂිකර්ම පර්යේෂණායතන වලට ආධාර දීම සම්බන්ධයෙන් යූ.එස්.ඩී.ඒ. නිලධාරිහු ආයතනයට පැමිණි බව අධ්‍යක්ෂකවරයා වාර්තා කළේය. ඔවුන් විසින් කලින් උදව් කරන ලද වටපණුවන් සම්බන්ධ වැඩ සටහනක් බඳු වැඩ සටහනක් ඉදිරිපත් කරන ලෙස ඔවුන් ආයතනයෙන් ඉල්ලා සිටින ලදී. මෙවැනි ක්‍රමයකට ආධාර දෙනු ලබන්නේ එයින් එක්සත් ජනපදයට යම් ප්‍රයෝජනයක් වෙතොත් පමණි. ක්‍රම දෙකක් සඳහා ආධාර ඉල්ලිය හැකියැයි අධ්‍යක්ෂකවරයා පැවසීය.

(i) ෂොට් හෝල් ගුල්ලන් පිළිබඳ පර්යේෂණ

(ii) ක්ෂණික තේ හා තේ පිළිබඳ ජීවරසායන විද්‍යා පර්යේෂණ

මෙයින් ආධාර ලැබෙතොත් ජීව රසායන විද්‍යා හා කෘෂි විද්‍යා අංශවල නිලධාරී වැටුප්, උපකරණ ආදිය වෙනුවෙන් යන වියදම් ඉතිරි කර ගත හැකිවේ. මොවුන් සමඟ කළ සාකච්ඡාවන්ගේ ප්‍රතිඵල දැනටමත් කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය මගින් විමසා ඇත. මේ කරුණු පිළිබඳව තවදුරටත් කටයුතු කිරීමට මණ්ඩලයේ අනුමැතිය දෙන්නේ දැයි ඔහු විමසීය. ලැබෙන ආධාර අවුරුදු 5 ක කාල සීමාවක් සඳහා වේ.

කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය මගින්, මොවුන්ගෙන් ආධාර ලබා ගැනීමට තව දුරටත් කටයුතු කරන ලෙස අධ්‍යක්ෂකවරයාට බලය දෙන ලදී.

(ආ) මණ්ඩලයේ මුද්‍රාව

පහත සඳහන් ලියකියවිලි වල මණ්ඩලයේ මුද්‍රාව තබන ලද බව වාර්තා කරන ලදි.

තරල පත්ල වියලනය සම්බන්ධයෙන් ජාතික පර්යේෂණ සංවර්ධන මණ්ඩලය සමග ගිවිසුම—1967.11.13.

මිඩ්ල්ටන් මහතාගේ යෝජනය මෝයි මහතා ස්ථිර කිරීමෙන් හන්තාන ඉඩම් විකිණීම ගිවිසුමට මණ්ඩලයේ මුද්‍රාව තැබීම අනුමත විය.

(ඇ) පත්වීම්, ඉල්ලා අස්වීම් ආදිය

පහත සඳහන් කරුණු වර්තා කරන ලදි.

(i) පත්වීම

ආචාර්ය වී. පී. බවානන්දන්, කෘෂිකර්ම රසායනඥ — මසකට රු. 1,100 ක වැටුපක් උඩ 67.11.2 සිට

(ii) ඉල්ලා අස්වීම

ආචාර්ය පී. සිවප්‍රකාශපිල්ලේ, පර්යේෂණ නිලධාරී, කර්මාන්ත ශිල්පාංශය—67.10.19 සිට

(iii) විදෙස් පුහුණුවෙන් පසු පෙරළා පැමිණීම

පැලැට් භෞතවේද අංශයේ කර්මාන්තඥ සහයක ඩී. ජානකිරාම් මහතා එම්. එස්සී. උපාධිය ලැබ 67.11.4 වන දින ඉන්දියාවේ සිට නැවත පැමිණියේය.

(iv) විදෙස් නිවාඩුවෙන් පසු නැවත පැමිණීම

නියෝජ්‍ය අධ්‍යක්ෂක, හා කෘෂිකර්ම රසායන විද්‍යාව පිළිබඳ උපදේශක ජේ. ඒ. එච්. ටොල්හර්ස්ට් මහතා 67.11.15 වෙනි දින දිවයිනට පැමිණියේය.

(v) අස්කිරීම

විද්‍යාගාර කාර්ය සහයක එම්. ආසිර්වාදම් මහතා 67.7.20 වෙනි දින

(vi) විදෙස් සංචාර

ටොක්ලායි පර්යේෂණායතනයේ 23 වෙනි වාර්ෂික සම්මේලනයට සහභාගි වීම සඳහා සහකාර අධ්‍යක්ෂක ආචාර්ය එල්. එච්. ප්‍රනාන්දු මහතා 1967.11.5 වෙනි දින ඉන්දියාව බලා පිටත්වූ අතර 1967.11.24 වෙනි දින නැවත දිවයිනට පැමිණියේය.

රැස්වීම අවසානයේදී සභාපතිවරයා සාමාජිකයන්ට සුබ නත්තලක් හා වාසනාවන්ත නව වසරක් පැතීය.

ඒ. සී. පෙරේරා,
ලේකම්.

පෝඩ් රෝඩ්ස් තෝන්ටන් සහ සමාගම
වරලත් ගණකාධිකාරිහු

තැ.පෙ. අංක 186,
කොළඹ.

පෞද්ගලික හා රහස්‍ය යි.

ඔඩිටර් ජෙනරාල්,
කොළඹ.

ප්‍රිය මහත්මය,

**1967 දෙසැම්බර් 31 වෙනි දයින් අවසන් වන වසර සඳහා ලංකා තේ පයෙර්ෂණායතනයේ ගිණුම්**

ඉහත සඳහන් ගිණුම් පරීක්ෂා කිරීම අප විසින් සම්පූර්ණ කොට ඇති අතර මෙම වාර්තාව සමග පහත සඳහන් ලියවිලි එවා ඇත.

(1) 1967 දෙසැම්බර් 31 වෙනි දිනට ශේෂ පත්‍රය.

(2) 1967 දෙසැම්බර් 31 වෙනිදයින් අවසන් වන වර්ෂය සම්බන්ධයෙන් පහත එන වතුයායවල කාරක ගිණුම

(අ) සාන්ත කූම්බ්ස් වතුයාය

(ආ) සාන්ත ජොයකිම් වතුයාය

(3) 1967 දෙසැම්බර් 31 වෙනිදයින් අවසන් වන වසර සඳහා අයවැය ගිණුම.

(4) 1967 දෙසැම්බර් 31 වෙනිදයින් අවසන් වන දිනට ණය හිමියන් හා ප්‍රතිපාදන පිළිබඳ සංක්ෂිප්ත විස්තරය.

(5) 1967 දෙසැම්බර් 31 වෙනි දිනට ස්ථාවර වත්කම් ලේඛනය. මිළ, සමුච්චිත ක්ෂය හා ලියා හළ අගය දක් වේ.

(6) 1967 දෙසැම්බර් 31 වෙනි දිනට ආයෝජනයන් පිළිබඳ සාරාංශය.

(7) 1967 දෙසැම්බර් 31 වෙනි දිනට අතැති තොග පිළිබඳ විස්තරය.

(8) 1967 දෙසැම්බර් 31 වෙනි දිනට ණයකරුවන් හා ණය ශේෂය පිළිබඳ සංක්ෂිප්ත විස්තරය.

(9) 1967 දෙසැම්බර් 31 වෙනි දිනට කාර්ය මණ්ඩල ණය කරුවන් පිළිබඳ විස්තරය.

(10) 1967 දෙසැම්බර් 31 වෙනි දිනට තැන්පත් මුදල් පිළිබඳ ප්‍රකාශය.

(11) 1967 දෙසැම්බර් 31 වෙනි දිනට අතැති මුදල් හා බැංකු ශේෂය පිළිබඳ විස්තරය.

1 **වර්ෂයෙහි ප්‍රතිඵලය**

ස්ථාවර වත්කම් වල ක්ෂය සඳහා රුපි: 713,914.44 ක් අය කිරීමෙන් පසු වර්ෂයෙහි ප්‍රතිඵල වලින් පෙනී ගියේ රුපියල් 500,963.86 ක ලාභයකි. ලාභය සෑදුණේ මෙසේ ය.

| | | |
|---|---|---|
| ආයතනය වියදමට අධික ආදයම | ... | රුපි: 471,431.44 |
| සාන්ත කූම්බ්ස් වතුයාය—ලාභය | ... | ,, 90,401.85 |
| සාන්ත ජොයකිම් වතුයාය—පාඩුව | ... | ,, 60,869.43 |
| | | රුපි: 500,963.86 |

පසුගිය වසරෙහි පාඩුව රුපි: 17,245.18 ක් වූ අතර ක්ෂය සඳහා වෙන් කළ මුදල රුපි: 954,543 යක් විය.

## 2 මණ්ඩලයේ නීති

කෙටුම්පත් කොට තිබූ මණ්ඩලයේ නීති, අප විගණනය කරන අවස්ථාවේදී, මණ්ඩලය මගින් අනුමත කොට නොතිබුණි. මෙම නීති මණ්ඩලයේ විශේෂ කමිටුවක් වෙත පවරා ඇති බව අපට දැන ගන්නට ලැබිණ.

කාර්ය සංවිධාන සංග්‍රහයක් සූදනම් වෙමින් පවතින බව අපට දැන ගන්නට ලැබිණ. සැළසුම සඳහා අවශ්‍ය වූ විට පහසුවෙන් ලබා ගත හැකිවන පරිදි ගිණුම් පිළිබඳව මණ්ඩලයේ තීරණ දැන ගත හැකි වන සේ මෙය ඉක්මණින්ම සූදනම් කළ යුතු වේ.

## 3 1967 දෙසැම්බර් 31 වෙනි දිනට ශේෂ පත්‍රය

පහත දක්වා ඇති ශේෂ පත්‍රයෙහි ඇතුලත් කරුණු පිළිබඳව අප විසින් සියුම් ලෙස විමසීම් කරන ලදී. පහත දැක්වෙන ලෙජර ගිණුම් සම්බන්ධයෙන් මෙසේ කරුණු දැක්වීමට අදහස් කරමු.

(i) සමුච්චිත අරමුදල

වසර තුළ අරමුදලෙහි ක්‍රියාකාරිත්වය මෙසේ ය.

| | | |
|---|---|---|
| 1967 දෙසැම්බර් මස 31 වෙනි දිනට ශේෂය ... ... | රුපි: | 13,953,965.52 |
| එකතු පසුගිය වසර සම්බන්ධයෙන් කරන ලද ගැලපීම් ... | ,, | 55,448.71 |
| | රුපි: | 14,009,414.23 |
| එකතු වියදමට වැඩි ආදායම ... ... ... | ,, | 500,963.86 |
| | රුපි: | 14,510,378.09 |

පසුගිය වසර සම්බන්ධයෙන් කරන ලද ගැලපීම් මෙසේ ය.

| බැර | රු: ශත |
|---|---|
| නැවත අගය කළ ගණන් හා නව ප්‍රමාණයන් අනුව නැවත ගණන් බලන ලද ක්ෂය නිසා කරන ලද ගැලපීම් ... ... | 93,858.89 |
| රුපියලෙහි අගය අඩුකිරීම නිසා විනිමය සම්බන්ධයෙන් වූ වෙනස | 6,744.11 |
| මෙම වසර තුල තොග යටතට ගෙනෙන ලද අමතර මොටෝ රථ කොටස්වල සියයට 50 ක අගය ... ... ... | 6,614.81 |
| තොග පාලන ගිණුම් හා ගැනලාම බැලූ තොග අතර වෙනස ... | 1,129.55 |
| විවිධ ගැලපීම් ... ... ... | 2,009.60 |
| | 110,356.96 |

**හර**

1966 වසර සඳහා වතුයාය නිලධාරීන්ට ගෙවන ලද ප්‍රසාද මුදල්:

| | |
|---|---|
| සාන්ත කුම්බ්ස් වතුයාය ... ... | 5,385.17 |
| සාන්ත ජෝයකිම් වතුයාය ... ... | 3,098.00 |
| | 8,483.17 |

නැවත අයකර ගත නොහැකි වියදම—

| | | |
|---|---|---|
| සාන්ත ජොයකිම් වතුයාය තවාන. ලියා හරින ලදි ... ... ... ... | 4,979.52 | |
| සාන්ත ජොයකිම් වතුයාය විගණන ගාස්තු ... | 1,823.35 | |
| ආදායමය ස්වරූපයක් ඇති නමුත් 1966 වසරේදී ප්‍රාග්ධන වශයෙන් ගෙන තිබූ කරුණු ... | 25,356.34 | |
| පිස්ටනයක් සහ ලයිනර් 2 ක් විකිණීමෙන් තොග වලට වූ පාඩුව ... ... ... | 6,256.10 | |
| විවිධ ගැලපීම් ... ... ... | 8,009.77 | 54,908.25 |
| ... | රු: | 55,448.71 |

රුපියලෙහි අගය අඩුවීම නිසා විනිමයෙහි වූ වෙනස එනම් රුපි: 6,744.11 හා තොග සමහරක් විකිණීමෙන් වූ පාඩුව එනම් රුපි: 6,256.10 විවිධ ගෙවීම් ගිණුම යටතේ ගැලපිය යුතුව තිබුණි.

වතුයාය ගිණුම්වල වියදම් දක්වීම සඳහා නිසි පරිදි ඉඩ සලසා නොතිබීම නිසා 1966 යේදී සාන්ත ජොයකිම් වතුයායෙහි පාඩුව රුපි: 9,900 කින් අඩු කොට දක්වා තිබුණි. සාන්ත කුම්බස් වතුයායෙහි ලාභය රුපි: 5,385/- කින් වැඩි කොට දක්වා තිබුණි. සෑම වසරකදීම ආයතනයේ ගිණුම් අවසන් වශයෙන් සකස් කිරීමට පෙර මේවා ගැලපිය යුතු යැයි අපි අදහස් කරමු.

(2) බැර කරුවෝ

අතිරේක බැර කරුවන් යටතේ දක්වා ඇති සමහර ශේෂයන් පිළිබඳව පහත දක්වෙන නිරීක්ෂණයන් ඉදිරිපත් කිරීමට කැමැත්තෙමු.

(අ) ප්‍රකාශයන් සම්බන්ධයෙන් කලින් ලැබෙන දයක මුදල්.

ආයතනයේ ප්‍රකාශන විකිණීම සම්බන්ධයෙන් ලේක් හවුස් ආයෝජන සමාගමෙන් ලැබි රුපි: 456/– කලින් ලැබෙන මුදල් යටතෙහි දක්වා තිබුණි. මෙය අයවැය ගිණුම යටතේ දක්විය යුතුව තිබුණි. මෙම වරද හේතු කොට ගෙන ලාභ ප්‍රමාණය මේ ගණනින් අඩුව දක්වා තිබුණි.

දයක මුදල් සම්බන්ධයෙන් කල විමසීම්කදී පෙනී ගියේ 1968, 1969 සහ 1970 යන වසර වලට සම්බන්ධ රුපි: 377.47 ක් අය වැය ගිණුමට බැර කොට තිබුණු බවය.

මෙම ප්‍රමාණයන් මේ ගිණුම යටතේ ඉදිරියට ගෙන යා යුතුව තිබුණු අතර ඒ ඒ වර්ෂවලදී අය වැය ගිණුම් වලට බැර කළ යුතු විය.

(ආ) සුළු සැපයුම් කරුවෝ.

මුදල් හිඟකම හේතු කොට ගෙන, 1967 දෙසැම්බර් 31 වෙනි දිනට පෙර නො ගෙවන ලද පහත දක්වෙන මුදල් ප්‍රමාණයන්ද මෙයට ඇතුලත් කොට ඇත.

| | | | |
|---|---|---|---|
| | | | කිවයුතු දෑ |
| තේ පාලක ... ... ... | රුපි: | 175,000 | 68.10.18 දින ගෙවන ලදි. |
| රජයේ ණය 3 වෙනි වාරකය ... ... | ,, | 166,667 | විගණනය කරන අවස්ථාවේදී— 68.11.28 ගෙවා නොතිබුණි. |
| | රුපි: | 341.667 | |

ගෙවීමට නියමිතව ඇති ශේෂය සම්බන්ධයෙන් ස්ථිර කිරීම් බොහෝ සැපයුම්කරුවන් ගෙන් ලබා ගත හැකි විය. සැපයුම් කරුවන් තිදෙනෙක් ශේෂය පිළිබඳ එකඟ නොවූහ. මතභෙදයට භාජනය වී ඇති ප්‍රමාණය රුපි: 2,894.58 කි.

(ඇ) වතුයාය බැරකරුවෝ

සාන්ත ජොයකිම් බැර ප්‍රමාණය අතර මැණික් ගැරීමේ අයිතිය පැවරීමෙන් ලද රුපි: 27,711/- ක් ද අඩංගු වේ. මෙය අයවැය ගිණුමට හෝ කෙලින්ම සමුච්චිත අරමුදලට බැර කළ යුතුව තිබුණි. මේ වරද නිසා සුළු සැපයුම් කරුවන්ගේ ගිණුම වැඩියෙන්ද ආදායම රුපි: 27,711/- ක් අඩුවෙන්ද දක්වා තිබුණි.

(ඇ) රැඳි මුදල්

මත භෙදයක් හේතු කොට ගෙන එම්. අයි. හේමචන්ද්‍ර සමාගම වෙත ගෙවිය යුතු රුපි: 13,416.09 ක රැඳි මුදල් ප්‍රමාණයක් අප විගණනය කරන අවසථාවේද ගෙවා නො තිබුණි. වැඩිය ප්‍රමාදවී හමාර කිරීම නිසා ඇවර පාඩුවක් වශයෙන් රුපි: 1,150/- ක් අඩු කොට ඉතිරි මුදල ගෙවන්නැයි ගෘහ නිර්මාණ ශිල්පීන් විසින් අනුමත කොට ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් ගොඩනැගිලි කමිටුව තවම අවසාන තීරණයක් ගෙන නොමැත.

3. රජයේ නය

ශේෂ පත්‍රයෙහි එන දිනයේ දී රජයේ ණය ශේෂය සම්බන්ධයෙන්, තහවුරු කෙරෙන සහතිකයක් භාණ්ඩාගාරයෙන් ලබා ගත හැකි විය.

(4) ස්ථාවර වත්කම්

(අ) හරි වැරදි බැලීම

වතුයා දෙකෙහි ඔප්පුද ආයතනය සතු වාහනයන් හී ලියා පදිංචි සහතික ද පරීක්ෂා කිරීමෙන් රුපි: 2,852,088.46 ක් වටිනාකම් ඇති ස්ථාවර වත්කම් ඇතැයි අපට ගණන් බැලිය හැකි විය. 1967 දෙසැම්බර් 31 වෙනි දිනට, ආයතනය සතු අනෙක් වත්කම් 1968 දී අභ්‍යන්තර විගණන අංශය මගින් ගණන් ගනු ලැබීය.

(ආ) ස්ථාවර වත්කම් වලට කරන ලද එකතු කිරීම්

1966 දෙසැම්බර් 31 වෙනි දිනට සම්පූර්ණ නොකරන ලද සමහර කටයුතු සම්බන්ධයෙන්, අය හා වැය අංශවල ගොනු කළ යුතු කරනු ස්ථාවර වත්කම් යටතට ගෙන ඇති බව පසුගිය විගණන වාර්තාවෙහි සඳහන් කරන ලදී. 1966 දී ස්ථාවර වත්කම් යටතට ගොනු කොට තිබූ ආදායම පිළිබඳ කරුණුවල වටිනාකම රුපි: 25,356.34 ක් විය. 1966 දී කෙරීගෙන ගිය වැඩ වූ නමුත් ස්ථාවර වත්කම් යටතට ගෙන තිබූ වටිනාකම රුපි: 439,518.27 ක් විය.

අප විසින් කරන ලද පරීක්ෂණ වලදී හෙළිවූයේ සමාලෝචිත වර්ෂයේද රුපි: 16,000/- වටිනා අයහාර වැය ප්‍රමාණයක් ප්‍රාග්ධනිත කොට ඇති බවය. අභ්‍යන්තර විගණන වරුන් විසින් ස්ථාවර වත්කම් ගැන අවසන් වන විට මෙය නිවැරදි කරන බව අපට දැනගන්නට ලැබිණ.

(ඇ) ඉඩම් මිළ දී ගැනීම

ආයතනය මගින් අගරතැන්නේ භාවිතයට ගෙන ඇති ඉඩම් තවමත් ආයතනය මගින් මිළ දී ගෙන නොමැතිය සමාලෝචිත වර්ෂයේ දී. අග්‍රතැන්න කොටස හෙළි කිරීම නිසා ලැබුණු රුපි: 40,000/- ක ආධාර මුදලක් හිමිකරුවන් විසින් තබා ගෙන ඇති අතර එම මුදල් ආයතනයට පවරා නැත. ඉඩම් අත්කර ගැනීමේ කටයුතු අවසන් වූ පසු මෙය කරනු ලබන බව අප වෙත දන්වන ලදී. ආධාර මුදල් ගෙවනු ලබන්නේ ඉඩම් හිමියන්ට පමණක් වන හෙයිනි.

හන්තාන වතුයායේ ආයතනය පිහිටා ඇති කොටස් 1968 අගෝස්තුවේදී රුපි: 296,000/- කට මිළ දී ගන්නා ලදී. 1967 ජුලි 31 වෙනි දින ආයතනය මිළදී ගත් කහටගහහේන ඉඩම පිළිබඳව ගිණුම්වල ඉඩ ප්‍රස්ථා සලසා නොතිබුණි. මෙම ඉඩම රුපි: 58,285/- කට අගය කොට ඇත.

(ඇ) බද්දට ගෙන ඇති ඉඩම්

පස්සර ඇති ඉඩම බදු අරගෙන ඇත. බදු ඔප්පුව අනුව 1995 හේදී ඔප්පුව අවලංගු වන විට මෙම ස්ථානයේ තනනු ලැබ ඇති ඉඩම් සඳහා ආයතනයට වන්දි ගෙවනු නො ලැබේ. 1967 දෙසැම්බර් 31 වෙනි දිනට පස්සර තනා ඇති ගොඩනැඟිලිවල වටිනාකම රුපි: 156,719/- ක් විය. බද්ද අවසන් වන දිනට වටිනාකමද ක්‍රමයෙන් නැති වී යන පරිදි ක්ෂය ප්‍රමාණයක් නියම කරන ලෙස අපි යෝජනා කරමු.

(5) ආයෝජන

රුපි: 517,112.50 ක වටිනාකමක් ඇති රජයේ සුරැකුම් පත් පිළිබඳ ලියවිලි අප විසින් පරීක්ෂා කරන ලදි. එක්සත් රාජධානියේ සුරැකුම් පත් පිළිබඳ ලියවිලි තමන් සතුව ඇති බැව් නැෂනල් හා ග්‍රින්ලේස් බැංකුව ස්ථිර කොට ඇත. මෙම සුරැකුම් පත්වල වටිනාකම රුපි: 62,362.80 ක් විය. 1967 දෙසැම්බර් 31 වෙනි දිනට ආයෝජනයන් ගේ මුළු වෙළෙඳ මිළ රුපි: 545,000/- ක් විය. ශේෂ පත්‍රයෙහි දක්වා ඇතිවිය මිළ මෙම වෙළෙඳ පොළෙහි මිළට වඩා රුපි: 34,000/- ක් වැඩි විය.

(6) තොග

ආයතනය සතුව තිබුණු තොග පිළිබඳ විස්තරයක් මෙම වාර්තාවට යා කොට ඇත.

(අ) තොග ගැනීමේ පිළිවෙත

තොග ගැනීමේ පිළිවෙතෙහි ඇති, පසුගිය වසරෙහි අප විසින් පෙන්වා දෙන ලද ඌනතාවයන් සමාලෝචිත වර්ෂයේ දී හරිගස්සා තිබුණි.

රුපි: 14,155.56 ක් වටිනා ටයර් 14 ක් 1967 දෙසැම්බර් 31 වෙනිද ගැනලාම හරි වැරදි නොබලන ලදි. මේවා පහත රට ස්ථානයේ තිබෙන බව අප වෙත දන්වන ලදමුත් වගකිව යුතු නිලධාරියකුගෙන් මේ පිළිබඳව ස්ථිර කිරීමක් ලබා ගත නොහැකි විය.

(ආ) කාර්යාලීය තොග පත්‍ර

1966 දෙසැම්බර් 31 වෙනි දින ගැනලාම හරි වැරදි බැලීමේදී ලබා ගත් සංඛ්‍යාවන්ට ගැලපෙන පරිදි මෙම වර්ෂයේ දී කාර්යාලීය තොග පත්වල ගණන් ගලපන ලදි. මෙම වෙනසට හේතු සොයා ගැනීමට කිසිම උත්සාහයක් නොකරන ලදි. මෙය බොහෝ දුරටම සිදුවන්නට ඇත්තේ ලැබීම් හා දීම් නිසි පරිදි වාර්තා නොකිරීම නිසාය.

1967 දෙසැම්බර් 31 වෙනි දින ගැනලාම ගණන් බැලීමකදී කාර්යාල තොග පත්වල පෙනෙන ශේෂය හා සසඳා බලන ලදි. අධිකතා තිබුණේ රුපි: 638.36 කි. හිඟ වූයේ රුපි: 1,139.20 කි. මෙය සතුටුදායකයැයි සැලකිය හැකිය.

(ඇ) නොවිකුණෙන තොග

රුපි: 800/– ක් පමණ වටිනාකමක් ඇති ආයතනයට අනවශ්‍ය තොග කොටසක් තිබුණි. 1968 සැප්තැම්බර් 18 වෙනි දින විශේෂ කමිටුවේ විධානය පරිදි ආයතනයට අනවශ්‍ය අලුත් ටයර් සහ ටියුබ් නැවත පිරවූ ටයර් හා අමතර කොටස් පිළිබඳව විස්තරයක් සූදනම් කරන ලද බව අපට පෙනිණ.

යථා කාලයේදී මේවා විකුණනු ලබන බවද අපට දැනගන්නට ලැබිණ.

(ඈ) අත්හැරීම

1967 දෙසැම්බර් 31 දතම ශේෂ පත්‍රයෙන් පහත සඳහන් තොග වල වටිනාකම ඇතුලත් නොවිණ.

| | | |
|---|---|---|
| බොනෝ පොම්පයේ අමතර කොටස් (ප්‍රාග්ධන යටතේ දක්විණ) ... ... | රුපි: | 3,767 |
| ඇලුමිනියම් වයර් ... ... ... | ,, | 1,000 |
| ඇලම් ... ... ... ... | ,, | 3,000 |
| සෝඩා කුඩු ... ... ... ... | ,, | 1,400 |
| | රුපි: | 9,167 |

ඉහත දැක්වුණු අත් හැර දැමීම නිසා ලාබ ප්‍රමාණය රුපි: 5,400/- කින් අඩුව දක්වා තිබුණි.

විවිධ අංශවල තිබුණු පාරිභෝජ්‍ය භාණ්ඩ තොග වියදම් වශයෙන් ලියා හරින ලදි. අනාගතයේ දී වර්ෂය අවසානයේ දී ඉතිරිවන පාරිභෝජ්‍ය භාණ්ඩ පිළිබඳ විස්තරයක් සකස් කළ යුතු යැයි අපි අදහස් කරමු. මෙලෙස දැක්වෙන ප්‍රමාණය සැහෙන්නක් නම් මේ වටිනාකම තොග වශයෙන් දැක්විය යුතුය.

නැවත පුරවන ලද ටයර් ද අගය කොට තොග යටතට ගෙන ආ යුතුය.

(7) ණයකරුවන් හා ණය ශේෂය

ණයකරුවන් හා ණය ශේෂය පිළිබඳ විස්තර අඩංගු ප්‍රකාශයක් මෙම වාර්තාවට යා කොට ඇත. ඒ පිළිබඳ අප අදහස් මෙසේය—

(අ) රක්ෂණ ඉල්ලීම්

රුපි: 1,728.71 ක් වන ගෙවීම් ප්‍රමාණයක් දිගුකලක සිට අයවිය යුතුව ඇති අතර එය ලබා ගත හැකි බවක් නොපෙනේ. මෙය ලියා හල යුතුයැයි අපි යෝජනා කරමු.

(ආ) අනෙක් ණය කරුවෝ

අයවිය යුතු ප්‍රමාණයෙන් රුපි 650 පමණ ලබා ගත නොහැකි බව පෙනේ.

iv. වතුයාය කාරක ගිණුම

(1) සාන්ත කුම්බස් වතුයාය

වතුයාය මෙහෙය වීම සම්බන්ධව සංඛ්‍යා ලේඛන පහත දක්වාලමු—

| | | 1967 | | 1966 |
|---|---|---|---|---|
| නිෂ්පාදිත තේ ... ... ... | රාත්: | 457,727 | රාත්: | 431,497 |
| විකිණීමෙන් ලත් මුදල් ... ... | රුපි: | 1,020,221.59 | | 1,061,401.90 |
| රාත්: සාමාන්‍ය විකුණුම් මිළ ... ... | | 2.23 | | 2.46 |
| ක්ලෝන කැබෙලි විකිණීම ... ... | | 40,359.48 | | 23,312.00 |
| බදු, ගෙනයීම් ගාස්තු ඇතුලුව නිෂ්පාදිත වියදම ... ... | | 2.12 | | 2.07 |
| වතුයාය ගෙන යෑමේ ප්‍රතිඵල ... ... | | 90,401.00 | | 189,302.00 |

(2) සාන්ත ජොයකිම් වතුයාය.

| | | | | |
|---|---|---|---|---|
| නිෂ්පාදිත තේ ... ... ... | රාත්: | 279,202 | රාත්: | 251,457 |
| විකිණීමෙන් ලත් මිළ ... ... | රුපි: | 462,991.35 | රුපි: | 369,165.41 |
| රාත්තලක සාමාන්‍ය විකුණුම් මිළ ... | | 1.66 | | 1.47 |
| රාත්තලක නිෂ්පාදිත මිළ ... ... | | 1.88 | | 1.94 |
| වතුයාය ගෙන යෑමේ ප්‍රතිඵල (පාඩු) ... | | 60,869.43 | | 118,651.05 |

v. අය වැය ගිණුම

සමාලෝචිත වර්ෂයේ දී තේ සෙස් බද්දෙන් ආයතනයට ලැබුණු මුලු මුදල රුපි: 4,768,939.14 කි. පසු ගිය වසරේ ලැබුණේ රුපි: 4,402,800.67 කි. ලැබුණු සෙස් බද්දෙහි නිවැරදි භාවය මැණ ගැනීමට ක්‍රමයක් නොමැතිය. තේ පාලකවරයා ගේ 1967 වර්ෂයේ වාර්තාව අනුව පිට රට යවන ලද තේ ප්‍රමාණය රාත්: 479,605,629 කි. මේ ප්‍රමාණයෙන් අය විය යුතු සෙස් බද්ද 4,796,056.29 ඌනතාවය රුපි: 27,117/- ක් විය. පසුගිය වර්ෂයේ ද මේ අනුවම ගණන් බලන කළ රුපි: 11,357 ක ඌනතාවයක් විය. පිටරට යවන තේ සම්බන්ධයෙන් සෙස් බද්ද ඉදිරිපත් කරන විට ප්‍රධාන රේගු අයකැමි විසින් විස්තර සපයා නොමැත. 1968 වර්ෂයේ සිට මෙය සිදුවන බව අපට දන්වන ලදි.

(2) වියදම්

(අ) සංඛ්‍යා ලේඛන

1967 දී කරණ ලද මුළු වියදම රුපි: 3,773,000/- ක් වූ අතර පසුගිය වසරේ එය රුපි: 3,625,000/- ක් විය. රුපි: 148,000/- අධික ලෙස වියදම් වූයේ ප්‍රධාන කොට පහත දැක්වෙන හේතු නිසාය.

| | | වියදම වැඩිවූ ප්‍රමාණය |
|---|---|---|
| රත්නපුර, පහත රට ස්ථානය ... ... ... | රුපි: | 91,000 |
| පුස්තකාලය හා ප්‍රකාශන ... ... ... | ,, | 67,000 |
| | රුපි: | 158,000 |

පහත රට ස්ථානය

(ආ) පහත රට ස්ථානයේ වියදම වැඩිවූයේ පහත සඳහන් කරුණු සම්බන්ධයෙනි.

| | | |
|---|---|---|
| දෙවු, අන්තර්මධ්‍ය හා කනිටු නිලධාරී වේතන හා විවිධ වේතන ... ... ... ... | රුපි: | 40,000 |
| දිනපතා ගෙවන කම්කරු පඩි ... ... | ,, | 22,000 |
| විද්‍යා කටයුතු හා නිලධාරී ගමන් ... ... | ,, | 29,000 |
| | රුපි: | 91,000 |

(ඇ) පුස්තකාලය හා ප්‍රකාශන

| | | |
|---|---|---|
| 1967 වියදම ... ... ... ... | රුපි: | 143,000 |
| 1966 වියදම ... ... ... | ,, | 76,000 |
| | රුපි: | 67,000 |

වියදම් වැඩි වීමට හේතු සැකෙවින් මෙසේය.

| | | |
|---|---|---|
| නිබන්දනයේ වියදම් ... ... ... | රුපි: | 12,000 |
| තේ ත්‍රෛමාසිකයේ විශේෂ කලාපය ... ... | ,, | 20,000 |
| තේ පයෝෂණායතනයේ අත්පොත ... ... | ,, | 20,000 |
| 1967 සැප්තැම්බර් තේ ත්‍රෛමාසිකයේ අමතර පිටපත් ... ... | ,, | 6,000 |
| උපදෙස් පත්‍රිකා ... ... ... | ,, | 9,000 |
| | රුපි: | 67,000 |

විවිධ ප්‍රකාශනයන්ගේ පිටපත් නොවිකිණී තිබෙන බව අප වෙත දන්වන ලදී. මුද්‍රණය කරනු ලබන පිටපත් ප්‍රමාණය අඩු කිරීමෙන් වියදමෙහි ඉතිරි කිරීමක් කළ හැකි බව පෙනී යේ.

(ඇ) වැරදීම්

1967 කරණ ලද වියදම්, පහත සඳහන් හේතු නිසා රුපි: 25,636.38 කින් වැඩිව දක්වා තිබුණි.

| | | |
|---|---|---|
| නිලධාරීන් දෙදෙනකුට ශිෂ්‍යත්ව සඳහා වැඩිපුර ගෙවීම | රුපි: | 10,899.42 |
| අයට බැර කරන ලද ප්‍රාග්ධන වියදම් ... ... | ,, | 14,736.96 |
| | රුපි: | 25,636.38 |

## vi. අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශය මගින් කරන ලද කටයුතු ප්‍රමාණවත් නොවිය. කරන ලද කරුණු විමසීම්වලින් අපට පෙනී ගියේ අභ්‍යන්තර විගණන අංශයේ නිලධාරීන් ගෙන්, අනෙක් නිලධාරීන් නිවාඩු යන විට ඔවුන් ගේ කටයුතුද ඉටු කරවා ගන්නා බවය. පසුගිය වාර්තා වෙන් පෙන්වා දෙන පරිදි අභ්‍යන්තර විගණන අංශයෙන් කෙරෙන රාජකාරි ප්‍රමාණය පුලුල් කිරීමට පියවර ගත යුතුය.

## vii. අභ්‍යන්තර පාලනය

ආයතනයේ දැනට ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන විධි අප විසින් සමාලෝචනය කරන ලදි. ගමන් වියදම් හා වෛද්‍ය වියදම් ගෙවීම සම්බන්ධයෙන් අනුගමනය කරන ලද ක්‍රමයෙහි දූර්වල තැන් කිහිපයක් සඳහන් කරන ලදි. පස්සර හා රත්නපුර අකුරු ස්ථානවල ගෙවීම් අනුමත කිරීම, පුස්තකාලයේ ප්‍රකාශන විකිණීම හා මුදල් ලබා ගැනීම වාර්තා කිරීම, හා විදුලි භාණ්ඩ හා කරන ලද වැඩ සහතික කිරීම ආදියෙහි ද සදෙස් තැන් පෙන්විණ. මෙම දූර්වල කම් සවිස්තර ලෙස දැක්වෙන වාර්තාවක් අධ්‍යක්ෂක-වරයා වෙත යවන ලදි.

## viii. විගණන වැඩ සටහන

විගණන වැඩ සටහනෙහි පිටපතක් මෙම වාර්තාවට අමුණා ඇත.

අප විගණනයෙන් උද්ගත වූ කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂක වරයාගේ අවධානය යොමු කරවමින් සවිස්තර වාර්තාවක් 1968 දෙසැම්බර් 1 වෙනි දින අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරන ලදි.

විස්වාසී,

අත්සන් කළේ ෆෝඩ්, රෝඩ්ස්,
තෝන්ටන් සහ සමාගම.

පිටපත:—1. ආ.භා.කා./ලේ.,—පරීක්ෂිත ගිණුම් හා ඒ පිළිබඳ වාර්තාවේ පිටපත් සමඟ.

2. ගණන් පරීක්ෂක—ෆෙර්ඩ්, රෝඩ්ස්, තෝන්ටන් සහ සමාගම.

මගේ අංකය. ටී/4/10/7
1969 අප්‍රියෙල් මස 5 වැනි දින,
කොළඹ 7, රජයේ ගණන් පරීක්ෂක කාර්යාලයේදීය.

සභාපති,
තේ පර්යේෂණායතනය,
තලවකැලේ.

## 1967 දෙසැම්බර් 31 දයින් අවසන්වූ වර්ෂයේ ගිණුම් හා ගණන් පරීක්ෂණ වාර්තාව

1961 අංක 57 දරණ තේ පර්යේෂණ (සංශෝධන) පනතින් සංශෝධනය කරණ ලද තේ පර්යේෂණ ආඥා පනතේ (438 අධිකාරය) 13 (3) වගන්තිය ප්‍රකාරව, කෘෂිකර්ම හා ආහාර කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් පත්කරණ ලද ගණන් පරීක්ෂකයින් වන ෆෙර්ඩ්, රෝඩ්ස්, තෝන්ටන් සහ සමාගම විසින් 1967 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ තේ පර්යේෂණායතනයේ ගිණුම් පරීක්ෂා කරන ලදි. පරීක්ෂිත ගිණුම් සහ ගණන් පරීක්ෂකගේ වාර්තාව මෙයට අමුණා ඇත.

2. ගිණුම් ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ ආයතනයේ වැඩකරගෙන යෑමෙන් වූ අතිරික්තය රු. 5,00,964 ක් වන අතර ඉකුත් වර්ෂයේ මීට අනුරූප ඌණතාවය රු. 17,245 කි.

සමාලෝචිත වර්ෂය තුළදී වූ අතිරික්තය වන රු. 5,00,964 සෑදී ඇත්තේ මෙසේය:—

| | ආදායම | වියදම | වෙනස (–ඌණතාවය) (–අතිරික්තය) |
|---|---|---|---|
| | රු: | රු: | රු: |
| ආයතනය ... ... ... | 49,58,819 | 44,87,387 | 4,71,432 |
| සාන්ත කූම්බස් වත්ත ... ... | 10,60,581 | 9,70,180 | 90,401 |
| | | | 5,61,833 |
| සාන්ත ජෝයකිම් වත්ත ... ... | 4,63,557 | 5,24,426 | 60,869 |
| | | | 5,00,964 |

ගණන් පරීක්ෂක අනුව සමාලෝචිත වර්ෂයෙහි අතිරික්තය රු: 43,314 කින් අඩුවෙන් දක්වා ඇත. එය පහත සඳහන් ආකාරයෙන් සෑදී තිබේ.

| | ධන රු: ශත | රින රු: ශත |
|---|---|---|
| විවිධ ලැබීම්වලට බැරකරනුනොලැබූ, විනිමයවල වෙනස ... ... ... ... | 6,744.11 | |
| විවිධ ලැබීම්වලට හරකරනු නොලැබූවත්කම් අලවිකිරීමෙන් වූ පාඩුව ... ... ... | | 6,256. 10 |
| ණය හිමියන් යටතේ අඩංගුකරනු ලැබූ—1967 සඳහා ලැබුණු දායක මුදල් ... ... ... | 456.00 | |
| ආදායම් සහ වියදම් ගිණුමට බැරකරඇති, කලින් ගෙවනු ලැබූ දායක මුදල් ... ... ... | | 377.47 |
| ආදායම් සහ වියදම් ගිණුමට බැරකර නොමැති, මැණික් ගැරීමේ අයිතිවාසිකම් විකිණීම ... ... | 27,711.00 | |
| මූලධන ගතකළ අයභාර වියදම්,—(ඇස්තමේන්තුකළ) | | 16,000.00 |
| අතහැරුන තොග ... ... ... ... | 5,400.00 | |
| වැඩියෙන් සඳහන් කළ වියදම් ... ... | 25,636.38 | |
| | 65,947.49 | 22,633.57 |
| | — 22,633.57 | |
| | 43,313.92 | |

සමාලෝචිත වර්ෂයෙහි ආදයම වන රු: 49,58,819 මුදලෙහි එකතුකරන ලද සෙස් මුදල වන රු: 47,68,939 අඩංගු විය. (1967 සඳහා තේ පාලකගේ පාලන වාර්තාවේ දක්වා ඇති පරිදි) 1967 දී අපනයනය කරන ලද තේ රාත්තල් 47,96,05,629 මත වර්ෂයට ලැබිය යුතු සෙස් මුදල රු: 47,96,056 ක් වූ බව ගණකාධිකාරී පරීක්ෂක පවසා ඇත.

3. සමුච්චිත අරමුදල—රු: 1,45,10,378

1966 දෙසැම්බර් 31 වෙනි දිනට ආයතනයේ සමුච්චිත අරමුදල වූයේ රු: 1,39,53,966 කි. මෙය 1967 දෙසැම්බර් 31 වෙනි දිනට පහත දැක්වෙන පරිදි වැඩි වී ඇත.

| | රු: | රු: |
|---|---|---|
| 1967 ජනවාරි මස 1 වෙනි දිනට ශේෂය ... ... | | 1,39,53,966 |
| එකතුකරන්න: (i) ඉකුත් වර්ෂය වෙනුවෙන් කරන ලද ගැලපීම් ... | 55,448 | |
| (ii) අවුරුද්දේ ආදයම-වියදමට වඩා වැඩිවූ ප්‍රමාණය ... | 5,00,964 | 5,56,412 |
| | | 1,45,10,378 |

4. මූල ධන සංචිතය—රු: 44,10,936

ඉකුත් වර්ෂය තුළදී ස්ථාවර වත්කම් නැවත අගය කරණු ලැබූ අතර රු: 43,64,789 ක ශුද්ධ අතිරික්තය මූල ධන සංචිතයකට බැරකරණු ලැබුණි. ඉකුත් වර්ෂයේ අගයෙන් අතහැරුන වාහනවල අගයවූ රු: 46,147 හේතුකොටගෙන 1967 දෙසැම්බර් 31 වෙනි දිනට මෙම ගිණුමේ ශේෂය රු: 44,10,936 දක්වා වැඩිවිය.

5. රජයෙන් දෙන ලද ණය—රු: 14,99,999

1964 වර්ෂයේ පොලී නොමැතිව රජයෙන් ලැබුණ රු: 20,000,00 ක ණය මුදලේ 1967 දෙසැම්බර් 31 වෙනි දිනට ශේෂය මින් දැක්විණ. වරකට රු: 1,66,667 බැගින් කොටස් 12 කින් මෙම ණය මුදල ආපසු ගෙවියයුතු වේ.

6. ස්ථාවර වත්කම්—රු. 1,85,85,774

1967 දෙසැම්බර් 31 වැනි දිනට තිබූ ශේෂය මින් දැක්වෙන අතර මෙම මුදල සෑදී ඇත්තේ මෙසේය.

| | | | රු. | රු. |
|---|---|---|---|---|
| 1967 ජනවාරි 1 වැනි දිනට ශේෂය ... | | | 1,89,63,534 | |
| එකතුකරන්න: ඉකුත් වර්ෂයේ අගයෙන් අතහැරුන වාහනවල වටිනාකම ... ... | | | 46,147 | |
| | | | 1,90,09,681 | |
| අඩුකරන්න: ඉකුත් වර්ෂයේදී වැරදි සහගත ලෙස මූලධන ගතකර තිබූ කෙරීගෙන යන වැඩ හා මූලධන වියදම ... | | | 4,64,874 | 1,85,44,807 |
| (ලැබුණු ආධාර හා විකිණීම් හැර) වර්ෂය තුළදී කල එකතුකිරීම් ... ... | | | | 16,06,191 |
| | | | | 2,01,50,998 |
| අඩුකරන්න: 1966.12.31 දිනට ලියා අස්කල ක්ෂය ප්‍රමාණය ... | රු. 9,54,543 | | | |
| අඩුකරන්න: වැඩියෙන් ක්ෂය කල ප්‍රමාණය සඳහා ගැලපුම | 93,859 | | 8,60,684 | |
| වර්ෂය තුළදී ලියාඅස්කළ ක්ෂය ප්‍රමාණය | | | 7,13,915 | |
| | | | 15,74,599 | |
| අඩුකරන්න: විකිණූ වාහන සඳහා සමුච්චිත වූ ක්ෂය | | | 9,375 | 15,65,224 |
| | | | | 1,85,85,774 |

ගණන් පරීක්ෂක මෙසේ පෙන්වාදී ඇත—

(අ) දළ වශයෙන් රු. 16,000 ක අයභාර වියදම් ප්‍රමාණය සමාලෝචිත වර්ෂය තුළදී මූලධන ගත කර ඇත.

(ආ) ආයතනය විසින් පාවිච්චියට ගෙන තිබූ අග්‍රතැන්න කොට්ඨාශයෙහි ඉඩම අත්පත්කර ගැනීම සම්පූර්ණකර නොතිබිණ. ආයතනය ඉඩම ශුද්ධකර ඇති අතර දළ වශයෙන් රු. 40,000 පමණ වූ සහාය මුදලක් රජයෙන් ලැබීමට සුදුසුකම් ලබා තිබිණ. අත්කර ගැනීමේ ක්‍රියාමාර්ගය සම්පූර්ණ වනතෙක් මෙම මුදල දේපලවල අයිතිකරුගේ නියෝජිතයන් විසින් රඳවා තබාගෙන ඇත.

(ඇ) 1967 ජුලි 31 වැනි දින ආයතනය විසින් අත්පත්කරගනු ලැබූ කහටගහ-හේනෙහි පිහිටි ඉඩම වෙනුවෙන් රු. 59,285 ක මුදල ගෙවීම පිණිස ගිණුම්වල ප්‍රතිපාදනය සලසා නොතිබුණි.

(ඈ) පස්සර පිහිටි බද්දට ගන්නා ලද ඉඩම පිළිබඳ බදු ගිවිසුමෙහි, 1995 දී බද්ද අවසානවනවිට ආයතනය විසින් තනා ඇති ගොඩනැගිලි වල අගය වෙනුවෙන් වන්දිමුදලක් ආයතනයට නොගෙවන බව සඳහන් කර ඇත. 1967 දෙසැම්බර් 31 වැනි දිනට රු. 1.56,719 ක ප්‍රමාණයෙන් යුත් පස්සර පිහිටි ගොඩ-නැගිලිවල අගය, බද්ද අවසාන වන අවස්ථාව වනවිට, මිළ ක්‍රමක්ෂය වූ තරම් ප්‍රමාණයකින් ක්ෂය කළ යුතුයැයි ගණන් පරීක්ෂක යෝජනා කොට තිබේ.

## 7. බඩු තොග—රු. 5,67,773

i. 1967 දෙසැම්බර් 31 වැනි දිනට හරිවැරදි බැලූ බඩුතොගවල අගය මෙයින් දක්විණ.

ii. ගණන් පරීක්ෂක මෙසේ පෙන්වාදී ඇත:—

(අ) සමාලෝචිත වර්ෂය තුළදී, 1966 දෙසැම්බර් 31 වැනි දින කරනු ලැබූ විද්‍යාමානතා හරිවැරදි බැලීමේදී ලබාගත් සංඛ්‍යාවලට කායසීාලීය තොග පත්‍රිකා ගැලපුම් කොට ඇත. එහෙත් වෙනස් කම්වලට අදල හේතුන් සොයා බලා නැත.

(ආ) සෙමෙන් අලෙවි වන භාණ්ඩ විෂයයන් ගණනාවක්ම එහි තිබිණ.

(ඇ) නා නා ඒකකයන්ට නිකුත් කළ පාරිභොග කල හැකි බඩුතොග, වියදමට අයකර තිබුණි. මේ ඒකකයන්වල තිබූ පාරිභොගය කළහැකි භාණ්ඩ, වර්ෂය අවසානයේදී අගයකොට ගිණුම් ගත කළ යුතුයැයි ගණන් පරීක්ෂක යෝජනා කර ඇත.

## 8. පුස්තකාලය සහ ප්‍රකාශනයන්—රු. 1,43,000

පුස්තකාලය වෙනුවෙන් සහ තේ ශත සංවත්සර ප්‍රදර්ශනය සම්බන්ධව මුද්‍රණය කල විවිධ ප්‍රකාශණ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී දැරූ වියදම මෙයින් දක්විණ.

ගණන් පරීක්ෂක අනුව, විවිධ ප්‍රකාශණවල පිටපත් ගණනාවක්ම තොගයෙහි ඉතිරිවී තිබුණි.

## 9. අභ්‍යන්තර ගණන් පරීක්ෂණය

නිවාඩු ගෙන සිටි වෙනත් නිලධාරීන් වෙනුවට වැඩ බැලීම පිණිස අභ්‍යන්තර ගණන් පරීක්ෂණ අංශයේ නිලධාරීන් යොදවා තිබූ අතර අභ්‍යන්තර ගණන් පරීක්ෂණ අංශය විසින් කරනු ලැබූ වැඩවල ප්‍රමාණය ප්‍රමාණවත් නොවූ බැව් ගණන් පරීක්ෂක පෙන්වා දී තිබේ. ගණන් පරීක්ෂණයේ විෂයසීමාව පුළුල් කළයුතු බව ඔහු යෝජනා කර ඇත.

ඩී. ආර්. සෙට්ටිනායක,
ඔඩිටර් ජනරාල් වෙනුවට ය.

ලංකා තේ පයෙඨ්ෂණායතනය,
තලවාකැලේ,
1969 මැයි 6 වෙනිද.

ඔඩිටර් ජෙනරාල්,
ඔඩිටර් ජෙනරාල් කායෙඨාලය,
කොළඹ 7.

1967 දෙසැම්බර් 31 වෙනි දයින් අවසන් වන වර්ෂය සඳහා
විගණිත වාර්තාව හා ගිණුම්

ඔබේ අංක ඊ/4/10/7 හා 1969 අප්‍රියෙල් 5 දතම ලිපිය සම්බන්ධවයි. ඔබේ ලිපියෙහි 2, 6, 7, 8, සහ 9 යන ඡෙදයන් මගින් දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් මණ්ඩලයේ අදහස් මෙසේ ය.

(අ) 2. ගිණුම්වල ප්‍රතිඵල

(i) විනිමය සම්බන්ධයෙන් රුපි: 6,744/11 ක වෙනස

මෙම වෙනස ඇති වූයේ 1967 නොවැම්බර් මාසයේදී ලංකා රුපියලෙහි අගය පහත හෙළීමේ හේතුවෙනි. මෙම ප්‍රමාණය අතිරික්ත ගිණුම හා ගලපා ඇත.

(ii) වත්කම් විකිණීමෙන් වූ පාඩුව රුපි: 6,25,610

මෙය ඇති වූයේ 1967 මුල් භාගයේ දී පරණ පිස්ටන් හා ලයිනර් විකිණීමෙනි. මෙම භාණ්ඩ තිබුණේ පොදු තොග හා සමඟ ය. මෙම පාඩුව අතිරික්ත ගිණුම හා ගලපා ඇත. එසේ කරුනු ලැබුයේ මෙය වසර තුළ කරන ලද ගනු-දෙනු හා සම්බන්ධ නොවන හෙයිනි.

(iii) ප්‍රකාශනයන් සම්බන්ධයෙන් කලින් කරන ලද ගෙවීම් රුපි: 456/- සහ රුපි: 377/47.

මේ සම්බන්ධයෙන් දන් දැඩි ප්‍රවේශමකින් යුතුව ක්‍රියා කරනු ලැබේ. කලින් කරන ලද ගෙවීම් අනාගතයේ දී ඒ ඒ වර්ෂයන් වෙත හර කරනු ඇත.

(iv) මැණික් ගැරීමේ අයිතිය විකිණීම රුපි: 27,711/-.

1967 පෙබරවාරි මාසයේ සිට දෙවසක් යන තෙක්, සාන්ත ජොයකිම් වතු යායෙහි මැණික් ගැරීමේ අයිතිය පැවරීම හා මෙය සම්බන්ධය. මෙමබද්ද 1968 නොවැම්බරයේ දී අවසන් වූ අතර මෙයින් ලැබෙන ආදායම ඒ ඒ වර්ෂ සඳහා වෙන් කරනු ඇත.

(v) ප්‍රාග්ධනිත කළ අයභාර වැය — රුපි: 16,000/-.

දිගු කලක් භාවිතා කළ හෙයින් ප්‍රාග්ධනිත කළ භාණ්ඩ මෙයින් දක්වේ.

(vi) අත්හරින ලද තොග රුපි: 5,400/-.

1968 දී මේ භාණ්ඩ තොගවලට ඇතුලත් කරනු ඇත.

(vii) <u>අධිකව දක්වූ වියදම් රුපි: 25,636/38.</u>

මෙම මුදලෙන් රුපි: 10,000/- ක් නිලධාරීන් දෙදෙනකු වෙත ශිෂ්‍යත්ව සම්බන්ධයෙන් වැඩිපුර ගෙවන ලද මුදලක් දක්වේ. එය 1968 දී මෙම නිලධාරීන්ගෙන් අයකර ගනු ලැබීය.

(viii) <u>තේ සෙස් බද්ද.</u>

රෙගුවේ ප්‍රධාන අයකැමි, මාසිකව එවන සෙස් බද්ද සමග පිට රට යවන ලද තේ ප්‍රමාණය පිළිබඳව දූන් විස්තර එවනු ලැබේ.

(ආ) 6. <u>ස්ථාවර වත්කම්.</u>

(i) 2 (v) යටතේ ඇති අදහස් බලන්න.

(ii) මෙම කරුණ පිළිබඳව මණ්ඩලය දූන් සලකා බලනු ලැබේ.

(iii) මෙම ඉඩම 1967 ජූලියේ දී ආයතනය වෙත පවරා ගනු ලැබීය.

(iv) <u>බදු ඉඩම්.</u>

බදු කාල සීමාවේ ඉතිරි කාලය තුල පස්සර ඇති ගොඩනැගිලිවල වටිනාකම ලියා හරිනු ලැබේ.

(ඇ) 7. <u>තොග රුපි: 567,773/-.</u>

(i) මෙම වෙනසට හේතු 1968 සිට පරීක්ෂණය කර ගෙන යනු ලැබේ.

(ii) මෙම භාණ්ඩ විකුණා දැමීම සඳහා ටෙන්ඩර කැඳවා වැඩිම ටෙන්ඩර් කරුවන්ට දෙන ලදී. එතෙකුදු ටෙන්ඩර කරුවෝ මුදල් ගෙවා භාණ්ඩ ගෙන නොගියහ. මෙම භාණ්ඩ විකිණීමට ක්‍රියා කරගෙන යනු ලැබේ.

(iii) 1969 දෙසැම්බර යේ සිට, දෙපාර්තමේන්තුවල තොග ගණන් බැලීමත් කරනු ඇත.

(ඈ) 8. <u>පුස්තකාලය හා ප්‍රකාශන රුපි: 143,000/-.</u>

අමතරව ඇති තොග පුවත්පත්වල දැන්වීම් පල කිරීමෙන් පසුව විකුණා දැමීමට පියවර ගනු ඇත.

(ඉ) 9. <u>අභ්‍යාන්තර විගණනය.</u>

මෙම අංශයේ වැඩ කටයුතු දැනට බොහෝ සෙයින් පුළුල් කොට ඇත. මෙම නිලධාරීන් දූන් සෘජුවම අධ්‍යක්ෂවරයා යටතේ වැඩ කරනු ලැබේ. මෙම අංශය ශක්තිමත් කිරීමට පියවර ගනු ඇත.

විශ්වාසී,

අත්සන් කළේ එස්. පත්මනාදන්,
සභාපති.

ලංකා තේ පයෙෂීෂණායතන මණ්ඩලය.

## 1967 දෙසැම්බර් 31 වෙනි දිනට ශේෂ පත්‍රය

| 1966 | | රු: | රු: | රු: |
|---|---|---|---|---|
| | **සමුච්චිත අරමුදල** | | | |
| | 1966 දෙසැම්බර් 31 වෙනි දිනට ශේෂය ... ... ... | | 13,953,966 | |
| | **එකතු** | | | |
| | පසුගිය වසර සම්බන්ධ ගැලපීම් ... ... ... | | 55,448 | |
| | | | 14,009,414 | |
| | **එකතු** | | | |
| 13,953,966 | අවුරුද්ද තුළ වැයට වැඩි අය ... ... ... | | 500,964 | 14,510,378 |
| | **ප්‍රාග්ධන සංචිතය** | | | |
| 4,364,788 | වත්කම් නැවත ඇගයීමෙන් අතිරික්තය ... ... ... ... | | | 4,410,936 |
| 752;551 | ණය හිමියන් හා ප්‍රතිපාදනය ... ... ... ... ... | | | 1,143,365 |
| 1,666,666 | රජයේ ණය ... ... ... ... ... ... | | | 1,499,999 |
| 20,737,971 | රු: ... | | | 21,564,678 |

| 1966 | | | රු: | රු: | රු: |
|---|---|---|---|---|---|
| | **ස්ථාවර වත්කම්** | | | | |
| | 1965 දෙසැම්බර් 31 වෙනි දිනට ලිඛිත වටිනාකම හා පසුව එකතු කළ දේ ... ... ... | | 18,963,534 | | |
| | **එකතු** | | | | |
| | පසුගිය වසරේ අගය කිරීමෙන් අත්හැරුණු වාහන | | 46,147 | | |
| | | | 19,009,681 | | |
| | **අඩු** | | | | |
| | කෙරී ගෙන යන වැඩ සම්බන්ධයෙන් ගැලපීම් හා පසුගිය වසරේ වැරදීමකින්, ප්‍රාග්ධනිත කළ අයභාර වැය ... ... ... | | 464,874 | 18,544,807 | |
| 18,963,534 | ආධාර මුදල් හා වත්කම් විකිණීමෙන් ලත් ප්‍රමාණය අඩු කොට වසර තුළ එකතු කිරීම් ... | | ... | 1,606,191 | |
| | | | | 20,150,998 | |
| | 66.12.31 දිනෙන් අවසන් වූ වර්ෂයේදී ලියා හල ක්ෂය ... ... | 954,543 | | | |
| | **අඩු** | | | | |
| 954,543 | අධිකව ක්ෂයකළ ප්‍රමාණය ... | 93,859 | 860,684 | | |
| | වසර තුල ලියා හල ක්ෂය ... ... | | 713,915 | | |
| | | | 1,574,599 | | |
| | **අඩු** | | | | |
| | වාහන විකිණීමෙන් එක් වූ ක්ෂය ... ...... | | 9,375 | 1,565,224 | 18,585,774 |
| 18,008,991 | | | | | |
| | කෙරීගෙන යන ප්‍රාග්ධනමය වැඩ | | | | |
| | සාන්ත කුම්බස් ... ... ... ... | | | 13,784 | |
| 42,671 | රත්නපුර ... ... ... ... | | | 3,106 | 16,890 |
| | වියදම් මිළට, ලංකා රජයේ හා එ.ජා. රජයේ සුරැකුම් පත් ... ... (දළ වෙළෙඳ වටිනාකම රු: 545,000/-) | | | | 579,475 |
| 18,631,137 | | | | ... | 19,182,139 |
| | **ජංගම වත්කම්** | | | | |
| | තොග | | | | |
| | තේ, විකිණි මිළ ... ... ... | | 275,829 | | |
| | පොදු හා විදුලි භාණ්ඩ ... ... | | 188,749 | | |
| | ලිපි ද්‍රව්‍ය තොග ... ... ... | | 18,366 | | |
| | මොටෝ අමතර කොටස් ... ... | | 13,230 | | |
| | වතුයාය තොග ... ... ... | | 60,832 | | |
| | පහතරට ස්ථානයේ තොග ... ... | | 10,767 | 567,773 | |
| | ණය කරුවන් හා අනෙක් ණය ශේෂය ... | | 941,051 | | |
| | නිලධාරී ණය ... ...... ... | | 118,641 | | |
| | තැන්පත් ... ... ... ... | | 40,619 | | |
| 2,106,834 | බැංකුවේ හා අතැති මුදල් ... ... | | 714,455 | 1,814,766 | 2,382,539 |
| 20,737,971 | | | | රු: ... | 21,564,678 |

### ලංකා තේ පයෙ‍ෂණායතනය වෙත යවන ලද විගණනවරුන්ගේ වාර්තාව

ලංකා තේ පයෙ‍ෂණායතනයේ පොත් සමඟ ඉහත දක්වෙන ශේෂ පත්‍රය අප විසින් පරීක්ෂා කොට බලන ලදී. අපට අවශ්‍ය සියලුම තොරතුරුද, කරුණු පැහැදිලි කිරීම් ද අපට ලබා ගත හැකි විය. අප මතය අනුව, මෙම වාර්තාවෙහි එන ශේෂ පත්‍රය නිසිලෙසත්, ආයතනයේ මුදල් තත්ත්වය සැබෑ ලෙසින් දක්වෙන අන්දමටත් සකස් කොට ඇත.

අත්සන් කළේ ෆෝඩ්, රෝඩ්ස්, තෝන්ටන් සහ සමාගම
වරලත් ගණකාධිකාරිවරු.

1969 මාර්තු 20,
කොළඹ දීය.

අත්සන් කළේ එස්. පත්මනාදන් } ලංකා තේ පයෙ‍ෂණායතන
අත්සන් කළේ එල්. එච්. ප්‍රණාන්දු } පාලක මණ්ඩල වෙනුවෙන්

දෙවන උපලේඛනය

# ලංකා තේ පර්යේෂණායතනය.

## 1967 දෙසැම්බර් 31 වෙනි දිනෙන් අවසන් වන වසර සඳහා සාන්ත කූම්බස් වතුයාය කාරක ගිණුම.

| 1966 රුපි: | රුපි: | | රුපි: | රුපි: |
|---|---|---|---|---|
| | | **වතුයාය වියදම්** | | |
| | 215,341 | පොදු ගාස්තු ... ... ... | 198,007 | |
| | 128,119 | ක්ෂෙත්‍ර කටයුතු හා වගා ... ... | 150,018 | |
| 735,477 | 392,017 | නිෂ්පාදනය ... ... ... | 487,667 | 835,692 |
| 17,160 | | කොළඹ බ්‍රෝකර් වරුන්ගේ ගාස්තු ... ... | | 15,866 |
| 142,775 | | වට්නාකම් වෙළෙඳ බද්ද ... ... ... | | 118,622 |
| 189,302 | | අය වැය ගිණුමෙහි ශේෂය ... ... ... | | 90,401 |
| 1,084,714 | | | රුපි: ... | 1,060,581 |

| 1966 රුපි: | | | රාත්: | රුපි: |
|---|---|---|---|---|
| | | **තේ විකිණීමෙන් මුළු ආදයම** | | |
| | 1,044,642 | කොළඹ ... ... ... | 426,375 | 1,005,220 |
| | 5,536 | අභ්‍යාන්තර බී.ඕ.පී. ... ... | 1,968 | 4,031 |
| | 9,890 | අභ්‍යාන්තර බී.ඇම්. ... ... ... | 16,671 | 9,984 |
| | | අභ්‍යාන්තර බී.පී. ... ... ... | 587 | 241 |
| | 1,334 | කර්මාන්ත ශිල්පාංශය ... ... | 376 | 746 |
| | — | පරිතෝෂික ... ... ... | 8,750 | — |
| 1,061,402 | | | 457,727 | 1,020,222 |
| 23,312 | | ක්ලෝන කැබෙලි විකිණීම ... .. ... | | 40,359 |
| 1,084,714 | | | රුපි: ... | 1,060,581 |

## 1967 දෙසැම්බර් 31 වෙනි දිනෙන් අවසන් වන වසර සඳහා සාන්ත ජොයකිම් වතුයාය කාරක ගිණුම.

| 1966 රුපි: | රුපි: | | රුපි: | රුපි: |
|---|---|---|---|---|
| | | **වතුයාය වියදම්** | | |
| | 151,544 | පොදු ගෙවීම් ... ... ... ... | 170,071 | |
| | 104,139 | ක්ෂෙත්‍ර වැඩ හා වගා ... ... ... | 90,312 | |
| | 185,075 | නිෂ්පාදනය ... ... ... ... | 243,206 | |
| 478,165 | 37,407 | වෙනත් ගෙවීම් ... ... ... ... | — | 503,589 |
| 9,777 | 1,055 | කොළඹ බ්‍රෝකර් වරුන්ගේ ගාස්තු ... ... | | 9,769 |
| | | වට්නාකම් වෙළෙඳ බද්ද ... ... ... | | 11,068 |
| 487,942 | | | රුපි: | 524,426 |

| 1966 රුපි: | රුපි: | | රාත්: | රුපි: |
|---|---|---|---|---|
| | | **තේ විකිණීමෙන් මුළු ආදයම** | | |
| | 364,842 | කොළඹ ... ... ... ... | 272,907 | 459,445 |
| | 337 | අභ්‍යාන්තර බී. ඕ. පී. ... ... ... | 1,968 | 4,031 |
| | 1,517 | අභ්‍යාන්තර බී.ඇම්. ... ... ... | 3,889 | 1,558 |
| | — | අභ්‍යාන්තර කුඩු ... ... ... ... | 1,552 | 712 |
| | 2,160 | පරිතෝෂික ... ... ... ... | 29 | — |
| | | නොවිකිණි ඉතිරි ප්‍රමාණය ... ... ... | — | — |
| 369,165 | | | | |
| 6 | | | 279,202 | 462,992 |
| 120 | | බිම කුලිය ... ... ... ... ... | | 2 |
| 118,651 | | ක්ලෝන කැබෙලි විකිණීම ... ... ... ... | | 563 |
| | | අය වැය ශේෂය ... ... ... ... ... | | 563 |
| | | | | 60,869 |
| 487,942 | | | රුපි: ... | 524,426 |

# ලංකා තේ පර්යේෂණායතනය.

## 1967 දෙසැම්බර් 31 වෙනිදයින් අවසන්වන වර්ෂය සඳහා අය වැය ගිණුම.

| 1966 රුපි: | | රුපි: |
|---|---|---|
| 583,206 | දෙවු ශ්‍රෙණි නිලධාරී වැටුප් ... ... ... ... | 462,851 |
| 203,412 | අන්තර් මධ්‍ය ශ්‍රෙණි නිලධාරී වැටුප් ... ... ... | 163,736 |
| 484,203 | කනිටු නිලධාරී වැටුප් ... ... ... ... | 519,534 |
| 206,486 | සුළු සේවක නිලධාරී වැටුප් ... ... ... ... | 194,495 |
| 63,004 | විවිධ වැටුප් ... ... ... ... ... | 168,435 |
| 150,801 | දිනපතා ගෙවන කම්කරුවෝ ... ... ... ... | 311,461 |
| 259,653 | විද්‍යා හා කාර්මික ගබඩාව හා පොදු කාරක වියදම් ... ... ... | 233,695 |
| 75,867 | පුස්කාලය හා ප්‍රකාශන ... ... ... ... | 142,925 |
| 165,672 | පරිපාලනය ... ... ... ... ... | 125,430 |
| 139,416 | ගොඩනැඟිලි හා උපකරණ නඩත්තු කිරීම ... ... ... | 82,432 |
| 206,001 | පොදු ඒකාබද්ද සේවාවන් ... ... ... ... | 163,849 |
| 242,690 | නිලධාරීන්ගේ ගමන් ... ... ... ... ... | 253,701 |
| 131,152 | විවිධ ... ... ... ... ... | 146,098 |
| 350,000 | සුළු ඉඩම් හිමි උපදෙස් සේවය (තේ පාලක දෙපාර්තමේන්තුව) ... ... | 350,000 |
| 363,822 | පහත රට ස්ථානය රත්නපුර ... ... ... ... | 454,831 |
| 954,543 | ක්ෂය ... ... ...... ... ... | 713,914 |
| — | වියදමට වැඩි ආදයම ... ... ... ... ... | 500,964 |
| 4,579,928 | රුපි: ... | 4,988,351 |

| 1966 රුපි: | | රුපි: | රුපි: |
|---|---|---|---|
| | වතුයාය කාරක ගිණුමෙහි ශේෂය | | |
| 189,302 | සාන්ත කුම්බස් ... ... ... ... | 90,401 | |
| –118,651 | සාන්ත ජොයකිම් ... ... ... | –60,869 | |
| 70,651 | | | 29,532 |
| 4,402,801 | තේ සෙස් බද්ද ... ... ... ... ... | | 4,769,939 |
| 33,035 | පොළිය ... ... ... ... ... | | 39,582 |
| 2,832 | කඩය හා මස් ගබඩා කුලිය ... ... ... ... | | 2,885 |
| 12,810 | විවිධ ලැබීම් ... ... ... ... ... | | 78,339 |
| 10,308 | ක්ලෝන කැබෙලි විකිණීම ... ... ... ... | | 9,954 |
| 30,246 | අමු තේකොළ විකිණීම පස්සර හා කොට්ටාව ... ... ... | | 59,120 |
| 17,245 | ආදායමට වැඩි වියදම ... ... ... ... | | — |
| 4,579,928 | රුපි: ... | | 4,988,351 |

# 1967 ස්ථාවර වත්කම් ලේඛනය

| ගිණුම් ශීර්ෂය | | 66.12.31 දිනට වටිනාකම | 1967 දී එකතු කිරීම | විකිණීම | 67.12.31 වෙනි දිනට වටිනාකම | 66.12.31 එකතුවූ ක්ෂය | 1967 දී ක්ෂය | 1967 දී එකතුවූ ක්ෂය | 67.12.31 වන දිනට ලිඛිත වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|
| සාන්ත කුම්බස් වතුයාය දේපොළ ... ... | ... | 1,453,685.04 | 45,838.07 | — | 1,499,523.11 | — | — | — | 1,499,523.11 |
| සාන්ත ජොයකිම් වතුයාය දේපොළ ... | ... | 946,089.94 | 60,662.61 | — | 1,006,752.55 | — | — | — | 1,006,752.55 |
| ජල සැපයුම | —සාන්ත කුම්බස් ... | 255,889.25 | 9,661.80 | — | 265,551.05 | 10% 24,774.50 | 10% 25,588.93 | 50,363.43 | 215,187.62 |
| ජල සැපයුම | —සාන්ත ජොයකිම් ... | 159,286.30 | 9,781.96 | — | 169,068.26 | 10% 13,991.80 | 10% 15,928.63 | 29,920.43 | 139,147.83 |
| විද්‍යාගාර | —සාන්ත කුම්බස් ... | 557,338.84 | 304.00 | — | 557,642.84 | 4% 20,440.00 | 2% 11,146.78 | 31,586.78 | 526,056.06 |
| පරිපාලන ගොඩ නැගිල්ල | —සාන්ත කුම්බස් ... | 505,000.00 | — | — | 505,000.00 | 4% 20,200.00 | 2% 10,100.00 | 30,300.00 | 474,700.00 |
| විද්‍යාගාරය හා කායශාලය | —සාන්ත ජොයකිම් ... | 288,045.09 | — | — | 288,045.09 | 4% 10,122.20 | 2% 5,760.90 | 15,883.10 | 272,161.99 |
| දෙවු නිලධාරි නිවාස | —සාන්ත කුම්බස් ... | 2,347,212.65 | 1,633.60 | — | 2,348,846.25 | 4% 93,718.80 | 2% 46,-44.25 | 140,663.05 | 2,208,183.20 |
| දෙවු නිලධාරි නිවාස | —සාන්ත ජොයකිම් ... | 122,411.11 | 16,510.88 | — | 138,921.99 | 4% 4,854.60 | 2% 2,448.22 | 7,302.82 | 131,619.17 |
| අන්තර් මධ්‍ය නිවාස | —සාන්ත කුම්බස් ... | 721,214.72 | — | — | 721,214.72 | 4% 28,840.00 | 2% 14,424.29 | 43,264.29 | 677,950.43 |
| අන්තර් මධ්‍ය නිවාස | —සාන්ත ජොයකිම් ... | 212,093.65 | — | — | 212,093.65 | 4% 8,396.40 | 2% 4,241.87 | 12,638.27 | 199,455.38 |
| කනිටු නිලධාරි නිවාස | —සාන්ත කුම්බස් ... | 1,899,345.87 | 370,533.20 | — | 2,269,879.07 | 4% 75,799.12 | 2% 37,986.92 | 113,786.04 | 2,156,093.03 |
| කනිටු නිලධාරි නිවාස | —සාන්ත ජොයකිම් ... | 494,780.00 | 52,085.91 | — | 546,865.91 | 4% 19,553.60 | 2% 9,895.60 | 29,449.20 | 517,416.71 |
| විවිධ ගොඩනැගිලි ... | —සාන්ත කුම්බස් ... | 1,023,683.23 | 144,919.52 | — | 1,168,602.75 | 4% 35,756.00 | 2% 20,473.66 | 56,229.66 | 1,112,373.09 |
| විවිධ ගොඩනැගිලි | —සාන්ත ජොයකිම් ... | 89,158.13 | 98,581.93 | | 187,740.06 | 4% 3,162.40 | 2% 1,783.16 | 4,945.56 | 182,794.50 |
| අතිරේක ගොඩනැගිලි | —සාන්ත කුම්බස් වතුයාය | 940,126.47 | 1,818.33 | — | 941,944.80 | 4% 35,252.00 | 2% 18,802.53 | 54,054.53 | 887,890.27 |
| අතිරේක ගොඩනැගිලි | —සාන්ත ජොයකිම් වතුයාය ... | 394,643.99 | — | — | 394,643.99 | 4% 14,141.28 | 2% 7,892.88 | 22,034.16 | 372,609.83 |
| නොරිස් අනුස්මරණ ශාලාව | .... ... ... | 42,263.33 | — | — | 42,263.33 | 4% 1,680.00 | 2% 845.26 | 2,525.26 | 39,738.07 |
| කර්මාන්ත ශාලාව | —සාන්ත කුම්බස් ... | 538,699.49 | 75.00 | — | 538,774.49 | 4% 17,280.00 | 2% 10,773.99 | 28,053.99 | 510,720.50 |
| කර්මාන්ත ශාලාව | —සාන්ත ජොයකිම් ... | 1,276,825.77 | 16,628.58 | — | 1,293,454.35 | 4% 49,055.20 | 2% 25,536.52 | 74,591.72 | 1,218,862.63 |
| හන්තාන අතුරු ස්ථානය | | | | | | | | | |
| විද්‍යාගාර හා කායශාල ගොඩනැගිලි ... | ... | 35,524.26 | 932.17 | — | 36,456.43 | 4% 1,384.00 | 2% 710.49 | 2,094.49 | 34,361.94 |
| කනිටු නිලධාරි නිවාස ... ... | ... | 110,000.00 | 63,375.10 | — | 173,375.10 | 4% 4,400.00 | 2% 2,200.00 | 6,600.00 | 166,775.10 |
| විවිධ ගොඩනැගිලි ... ... ... | ... | 33,995.08 | 27,938.46 | — | 61,933.54 | 4% 1,320.00 | 2% 679.90 | 1,999.90 | 59,933.64 |
| ගෘහ භාණ්ඩ ... ... ... | ... | 33,740.26 | 2,979.96 | — | 36,720.22 | 10% 2.112.80 | 10% 3,374.03 | 5,486.83 | 31,233.39 |
| කයශාලීය උපකරණ ... ... ... | ... | 10,157.50 | 1,940.50 | — | 12,098.00 | 10% 562.00 | 10% 1,015.75 | 1,577.75 | 10,520.25 |
| විද්‍යාගාර උපකරණ හා යන්ත්‍ර ... ... | ... | 38,797.80 | — | — | 38,797.80 | 10% 2,498.00 | 10% 3,879.78 | 6,377.78 | 32,420.02 |
| ජල සැපයුම ... ... ... | ... | 5,537.12 | 1,619.81 | — | 7,156.93 | 10% — | 10% 553.71 | 553.71 | 6,603.22 |
| විදුලි බල උපකරණ ... ... ... | ... | — | 10,274.72 | — | 10,274.72 | 10% — | 10% — | — | 10,274.72 |
| දේපළ ගිණුම—සංවර්ධනය ... ... | ... | — | 34,236.54 | — | 34,236.54 | — — | — — | — | 34,236.54 |
| ඉදිරියට ගෙන යන ලදි | ... | 14,535,544.89 | 972,332.65 | — | 15,507,877.54 | 489,294.70 | 282,988.05 | 772,282.75 | 14,735,594.79 |

# ස්ථාවර වත්කම් ලේඛණය 1967

| | 66.12.31 වෙනි දිනට වටිනාකම | 1967 දී එකතු කිරීම | විකිණීම | 67-12-31 වෙනි දිනට වටිනාකම | 66-12-31 එකතුවූ ක්ෂය | 1967 දී ක්ෂය | 1967 දී එකතුවූ ක්ෂය | 67-12-31 වෙනි දිනට ලිඛිත වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|
| ඉදිරියට ගෙනාවා ... | 14,535,544.89 | 972,332.65 | — | 15,507,877.54 | 489,294.70 | 282,988.05 | 772,282.75 | 14,735,594.79 |
| **පස්සර අතුරු ස්ථානය** | | | | | | | | |
| විද්‍යාගාර හා කාර්යාල ගොඩනැඟිලි ... ... | 41,000.00 | — | — | 41,000.00 | 4% 1,640.00 | 2% 820.00 | 2,460.00 | 38,540.00 |
| අන්තර් මධ්‍ය නිලධාරී නිවාස ... ... | 60.000.00 | — | — | 41,000.00 | 4% 1,640.00 | 2% 820.00 | 2,460.00 | 38,540.00 |
| කනිටු නිලධාරී නිවාස ... ... ... | 55,719.00 | — | — | 60,000.00 | 4% 2,400.00 | 2% 1,200.00 | 3,600.00 | 56,400.00 |
| ගෘහ භාණ්ඩ ... ... ... ... | 19,579.00 | 1,295.50 | — | 55,719.00 | 4% 2,000.00 | 2% 1,114.38 | 3,114.38 | 52,604.62 |
| කාර්යාලීය උපකරණ ... ... ... | 4,670.00 | 1,931.25 | — | 20,874.50 | 10% 1,676.40 | 10% 1,957.90 | 3,634.30 | 17,240.20 |
| විද්‍යාගාර උපකරණ හා යන්ත්‍ර ... ... | 18,841.44 | — | — | 6,601.25 | 10% 415.00 | 10% 067.00 | 882.00 | 5,719.25 |
| වාහන ... ... ... ... | 6,750.00 | — | — | 18,841.44 | 10% 300.00 | 10% 1.884.14 | 2,184.14 | 16,657.30 |
| ජල සැපයුම ... ... ... ... | — | 5,040.30 | — | 6,750.00 | 25% 1,687.50 | 25% 1,1687.50 | 3,375.00 | 3,375.00 |
| ජල සැපයුම අගරතැන්න ... ... ... | — | 7,553.18 | — | 5,040.30 | 10% — | — | — | 5,040.30 |
| දේපළ ගිණුම—සංවර්ධනය, අගරතැන්න ... | — | 74,362.10 | — | 7,553.18 | 10% — | — | — | 7,553.18 |
| | | | | 74,362.10 | — | — | — | 74,362.10 |
| **කොට්ටාව අතුරු ස්ථානය** | | | | | | | | |
| විද්‍යාගාර හා කාර්යාලීය ගොඩනැඟිලි ... ... | 14,000.00 | — | — | 14,000.00 | 4% 560.00 | 2% 280.00 | 840.00 | 13,160.00 |
| කනිටු නිලධාරී නිවාස ... ... ... | 40,000.00 | 33,811.57 | — | 73,811.51 | 4% 1,600.00 | 2% 800.00 | 2,400.00 | 71,411.57 |
| විවිධ ගොඩනැඟිලි ... ... ... | 63,402.00 | 27,192.68 | — | 90,594.68 | 4% 2,536.08 | 2% 1,268.04 | 3,804.12 | 86,790.56 |
| ජල සැපයුම ... ... ... ... | 2,200.00 | 11,815.00 | — | 14,015.00 | 10% 220.00 | 10% 220.00 | 440.00 | 13,575.00 |
| ගෘහ භාණ්ඩ ... ... ... ... | 11,843.50 | 2,048.50 | — | 13,892.00 | 10% 699.50 | 10% 1,184.35 | 1,883.85 | 12,008.15 |
| කාර්යාලීය උපකරණ ... ... | 635.00 | — | — | 635.00 | 10% 63.50 | 10% 63.50 | 127.00 | 508.00 |
| විද්‍යාගාර උපකරණ හා යන්ත්‍ර ... ... | 2,995.00 | — | — | 2,995.00 | 10% 299.50 | 10% 299.50 | 599.00 | 2,396.00 |
| දේපළ ගිණුම ... ... ... | — | 31,519.89 | — | 31,519.89 | — | — | — | 31,519.89 |
| ගෘහ භාණ්ඩ සාන්ත කුම්බස් ... ... | 632,313.22 | 29,526.60 | — | 661,839.82 | 10% 54,370.40 | 10% 63,231.32 | 117,601.72 | 544,238.10 |
| ගෘහ භාණ්ඩ සාන්ත ජොයකීම් ... ... | 154,661.52 | 19,917.38 | — | 174,578.90 | 10% 11,663.70 | 10% 15,466.15 | 27,129.85 | 147,449.05 |
| විදුලි බලය—සාන්ත කුම්බස් ... ... | — | 2,624.74 | — | 2,624.74 | 10% — | — | — | 2,624.74 |
| ටෙලිපෝන් සාන්ත කුම්බස් ... ... | — | 2,655.00 | — | 2,655.00 | 10% — | — | — | 2,655.00 |
| සවිකිරීම්–විදුලිබලය සාන්ත ජොයකීම් ... ... | 160,996.70 | 11,975.00 | — | 172,971.70 | 10% 16,099.67 | 10% 16,099.67 | 32,199.34 | 140,772.36 |
| සවිකිරීම්–ටෙලිපෝන් සාන්ත ජොයකීම් ... | 8,845.30 | — | — | 8,845.30 | 10% 884.30 | 10% 884.30 | 1,768.60 | 7,076.70 |
| කාර්යාල උපකරණ සාන්ත කුම්බස් ... ... | 98,413.74 | 9,920.87 | — | 108,334.61 | 10% 8,148.20 | 10% 9,841.37 | 17,989.57 | 90,345.04 |
| කාර්යාල උපකරණ සාන්ත ජොයකීම් ... ... | 17,900.50 | 2,937.25 | — | 20,837.75 | | | | |
| විද්‍යාගාර උපකරණ හා යන්ත්‍ර සාන්ත කුම්බස් ... | 772,377.76 | 186,234.39 | — | 958,612.15 | 10% 63,540.90 | 10% 77,237.76 | 140,778.66 | 817,833.49 |
| විද්‍යාගාර උපකරණ හා යන්ත්‍ර සාන්ත ජොයකීම් ... | 353,620.15 | 53,105.00 | — | 406,725.15 | 10% 15,307.90 | 10% 35,362.01 | 50,669.91 | 356,055.24 |
| කර්මාන්ත ශාලා උපකරණ සාන්ත කුම්බස් ... | 182,969.00 | 3,761.88 | — | 186,730.88 | 10% 18,296.90 | 10% 18,296.90 | 36,593.80 | 150,137.08 |
| ගෘහ භාණ්ඩ—වතුයාය ... ... ... | 26,490,00 | 130.00 | — | 26,620.00 | 10% 2,649.00 | 10% 2,649.00 | 5,298.00 | 21,322.00 |
| කාර්යාල උපකරණ සාන්ත කුම්බස් වතුයාය | 3,860.00 | — | — | 3,860.00 | 10% 386.00 | 10% 386.00 | 772.00 | 3,088.00 |
| කර්මාන්ත ශාලා උපකරණ සාන්ත ජොයකීම් වතුයාය | 725,307.00 | 11,255.42 | — | 736,562.42 | 10% 72,530.70 | 10% 72,530.70 | 145,061.40 | 591,501.02 |
| ගෘහ භාණ්ඩ සාන්ත ජොයකීම් වතුයාය | 28,341.00 | 271.30 | — | 28,612.30 | 10% 2,834.10 | 10% 2,834.10 | 5,668.20 | 22,944.10 |
| කාර්යාල උපකරණ සාන්ත ජොයකීම් ... | 5,274.49 | — | — | 5,274.49 | 10% 342.00 | — 527.44 | 869.44 | 4,405.05 |
| කර්මාන්ත ශාලා—විදුලිය සැපයීම සාන්ත ජොයකීම් ... | 94,305.00 | — | — | 94,305.00 | 10% 9,430.50 | 10% 9,430.50 | 18,861.00 | 75,444.00 |
| වාහන ... ... ... ... | | | | | | | | |
| සාන්ත ජොයකීම් වතුයාය ... ... | 15,240.00 | — | — | 15,240.00 | 25% 3,810.00 | 25% 3,810.00 | 7,620.00 | 7,620.00 |
| සාන්ත කුම්බස් ,, ... ... | 340,613.76 | 98,765.98 | 37,500.00 | 401,879.74 | 25% 67,277.75 | 25% 75,778.44 | 133,681.19* | 268,198.55 |
| සාන්ත ජොයකීම් ,, ... ... | 46,097.49 | 41,707.94 | — | 87,805.43 | 25% 6,286.81 | 25% 11,524.37 | 17,811.18 | 69,994.25 |
| | 18,544,806.46 | 1,643,691.37 | 37,500.00 | 20,150,997.83 | 860,684.31 | 713,914.44 | 1,565,223.75 | 18,585,774.08 |

| | |
|---|---|
| අඩු: විකුණන ලද වාහන ... ... ... | 37,500.00 |
| | 1,608,191.37 |

*වාහන සාන්ත කුම්බස්

| | |
|---|---|
| එකතුවූ ක්ෂය | 43,056.19 |
| අඩු විකුණු වාහන සඳහා ලියා හල ක්ෂය | 9,375.00 |
| | 133,681.19 |